සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2024
Third Term Test - Grade 12 - 2024

විභාග අංකය: ....

ආර්ථික විද්‍යාව - I

කාලය පැය 02 යි

උපදෙස්
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා උත්තර පත්‍රයේ නියමිත පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.

01. ''හිඟකම'' පිළිබඳ සංකල්පය පැහැදිලි කිරීමේදී වඩාත් යෝග්‍ය ප්‍රකාශය වන්නේ,
   (1) හිඟකම යනු ඇතැම් භාණ්ඩ වෙළෙඳපොළේ හිඟයක් දක්නට ලැබීමයි.
   (2) හිඟකම යනු අඩු ආදායම් ලාභී පවුල් මුහුණ දෙන ගැටලුවකි.
   (3) හිඟකම යනු පවත්නා සම්පත් වලින් මිනිස් වුවමනා සපුරා ගත නොහැකි තත්වයකි.
   (4) වෙළඳපොළ යාන්ත්‍රණය මත රඳා පවත්නා රටවල හිඟකම පිළිබඳව ප්‍රශ්නයක් දක්නට ඇත.
   (5) ආර්ථික වර්ධනය නිසා හිඟකම තුරන් වී යනු ඇත.

02. අභිමතානුරූපී ආර්ථික විද්‍යාත්මක ප්‍රකාශයක් වනුයේ,
   (1) වසංගත තත්වය නිසා ආර්ථික වෘද්ධිය පෙර වසරට සාපේක්ෂව මෙම වසරේ පහත වැටී ඇත.
   (2) සාමාන්‍ය භාණ්ඩයක මිල ඉහළ යන විට ඉල්ලුම් ප්‍රමාණය පහත වැටේ.
   (3) වෙළඳපොළේ භාණ්ඩ මිල ඉහළ යාම නිෂ්පාදකයින්ට හිතකර වේ.
   (4) මෑත කාලයේ ශ්‍රී ලංකාවේ උද්ධමනය තනි ඉලක්කමේ අගයකි.
   (5) අසීමිත වුවමනාවන්ට සාපේක්ෂව සම්පත් සම්භාරය සීමිත වේ.

03. පහත සඳහන් සංකල්ප අතරින් සූක්ෂම ආර්ථික විද්‍යාත්මක සංකල්පය කුමක්ද?
   (1) උද්ධමනය (2) ආර්ථික පසු බැසීම. (3) විනිමය අනුපාතය
   (4) හිඟකම (5) මුදල් සැපයුම

04. කෙසේ නිපදවනවාද? යන මූලික ආර්ථික ප්‍රශ්නයෙන් අදහස් වන්නේ,
   (1) සංයෝග කළ යුතු අමුද්‍රව්‍ය කවරේද යන්න තීරණය කිරීමයි.
   (2) ශ්‍රම හා ප්‍රාග්ධන සංයෝග අනුපාත තීරණය කිරීමයි.
   (3) නිපදවන්නේ රජය ද නැතහොත් පුද්ගලික අංශය විසින් ද යන්න තීරණය කිරීමයි.
   (4) නිෂ්පාදනයට යොදා ගන්නේ ශ්‍රමය පමණක් ද නැතහොත් ප්‍රාග්ධනය පමණක් ද යන්න තීරණය කිරීමයි.
   (5) විකල්ප නිෂ්පාදන අතරේ සම්පත් බෙදා හරින්නේ කෙසේද යන්න තීරණය කරීමයි.

05. පහත දැක්වෙන නිෂ්පාදිතයන් අතරින් භාවිතයේදී ආවස්ථික පිරිවැය ශූන්‍ය අගයක් ගන්නා නිෂ්පාදිතය කුමක්ද?
   (1) පාසල් ළමුන්ට නොමිලේ දෙන නිල ඇඳුම් (2) උපැස් යුවලක්
   (3) වන වගාවක් (4) ගොඩනැගිල්ලක්
   (5) කුලී මෝටර් රථයක්

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

06. නිෂ්පාදන සාධකයක් ලෙස ''භූමිය'' ට අදාළ වූ සුවිශේෂී ආර්ථික ලක්ෂණයකි.

(1) ඉපැයුම බදු කුලිය වීම. (2) සජීවී සාධකයක් වීම.

(3) ක්ෂය වීමකට ලක් වීම. (4) බදු කුලී ගණනය කිරීමේ හැකියාව

(5) ඵලදායිතාවයෙන් යුක්ත වීම.

07. පහත නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයේ නිෂ්පාදන සංයෝජනය A සිට B වෙත මාරුවීමෙන් පෙන්නුම් කරන්නේ,



(1) ආර්ථික අවපාත තත්ත්වයකි.

(2) විරැකියා තත්ත්වයේ වැඩිවීමකි.

(3) සේවා නියුක්තියේ වැඩි වීමකි.

(4) සම්පත් උපයෝජනයේ අකාර්යක්ෂමතාව අඩු වීමකි.

(5) නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව වැඩිවීමකි.

08. බලය පදනම් කරගත් සානුබල දක්නට ලැබෙන ආර්ථිකයකි.

(1) වෙළෙඳපොළ ආර්ථිකය (2) ධනේෂ්වර ආර්ථිකය

(3) ධනවාදී ආර්ථිකය (4) මිශ්‍ර ආර්ථිකය

(5) විධානගත ආර්ථිකය

09. ඉල්ලුමට බලපාන සාධක අතුරින් වෙළඳපොළ ඉල්ලුම් තීරකයක් වන, එහෙත් පාරිභෝගික ඉල්ලුම් තීරකයක් නොවන සාධකය වන්නේ කුමක්ද?

(1) සලකා බලන භාණ්ඩයේ මිල (2) සම්බන්ධිත භාණ්ඩවල මිල ගණන්

(3) පාරිභෝගික සංඛ්‍යාව (4) පාරිභෝගික රුචිය

(5) පාරිභෝගිකයාගේ ආදායම

10. පාරිභෝගිකයෙක් කිසියම් භාණ්ඩයක් මිලට ගැනීමට සූදානම් වන්නේ නම් ක්‍රය ශක්තිය හා බැදී වුවමනාවක් තිබිය යුතු ය. එවැනි ඉල්ලුමක් හඳුන්වනනේ,

(1) ආර්ථික ඉල්ලුම වශයෙනි. (2) සඵල ඉල්ලුම වශයෙනි.

(3) ව්‍යුත්පන්න ඉල්ලුම වශයෙනි. (4) පාරිභෝගික ඉල්ලුම වශයෙනි.

(5) වෙළෙඳපොළ ඉල්ලුම වශයෙනි.

11. කිසියම් භාණ්ඩයක මිල වෙනස් වුවද පාරිභෝගිකයන් ඉල්ලුම් කරන ප්‍රමාණයේ වෙනසක් ඇති නොකරන තත්වයක් යටතේ, එම භාණ්ඩයේ මිල 10% න් ඉහළ ගිය විට,

(1) නිෂ්පාදක අයහාරය 5%න් ඉහළ යනු ඇත.

(2) නිෂ්පාදක අයහාරය 18% ට වඩා අඩු ප්‍රමාණයකින් ඉහළ යනු ඇත.

(3) පාරිභෝගික පැහැදම ස්ථාවරව පවතිනු ඇත.

(4) පාරිභෝගික පැහැදම 10% න් ඉහළ යනු ඇත.

(5) පාරිභෝගික පැහැදම 10% න් පහළ යනු ඇත.

12. යම් භාණ්ඩයක වෙළඳපොළ සමතුලිතව පැවතිය දී එකවර ඉල්ලුමේ හා සැපයුමේ සිදුවන වැඩිවීමක් නිසා නිශ්චිතවම,

(1) සමතුලිත මිල ඉහළයාමක් සිදු වේ.

(2) සමතුලිත මිල අඩු වී සමතුලිත ප්‍රමාණය අඩුවීමක් සිදු වේ.

(3) සමතුලිත මිල වැඩි වී සමතුලිත ප්‍රමාණය අඩුවීමක් සිදු වේ.

(4) සමතුලිත මිල අඩු වී සමතුලිත ප්‍රමාණය වැඩිවීමක් සිදු වේ.

(5) සමතුලිත ප්‍රමාණය ඉහළ යාමක් සිදු වේ.

13. ඉල්ලුම් නීතිය වඩාත් නිවැරදි ලෙස විග්‍රහ කරන ප්‍රකාශය තෝරන්න.
    (1) භාණ්ඩයේ මිල හැර අනෙකුත් සාධක ස්ථාවරව පවතින විට ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වීමයි.
    (2) භාණ්ඩයේ මිල ස්ථාවරව තිබියදී අනෙකුත් සාධක වෙනස්වන විට මිල හා ඉල්ලුම අතර පවතින ප්‍රතිලෝම සම්බන්ධතාවයි.
    (3) භාණ්ඩයේ මිල හැර අනෙකුත් සාධක ස්ථාවරව තිබියදී මිල වෙනස් වන විට ආදේශන සහ ආදායම් ප්‍රතිවිපාකයන් හේතුවෙන් ඉල්ලුම් ප්‍රමාණය අනුලෝම ලෙස වෙනස්වීමයි.
    (4) භාණ්ඩයේ මිල සහ අනෙකුත් සාධක ස්ථාවරව පවතින විට ඉල්ලුම් ප්‍රමාණය වැඩිවන විට මිල අඩුවීමක් ද මිල අඩුවන විට ඉල්ලුම් ප්‍රමාණය වැඩිවීමක් ද සිදුවීමයි.
    (5) භාණ්ඩයේ මිල හැර අන් සාධක ස්ථාවරව තිබියදී මිල වෙනස්වන විට ආදේශන හා ආදායම් ප්‍රතිවිපාකයන් නිසා ඉල්ලුම් ප්‍රමාණයේ සිදුවන ප්‍රතිලෝම හැසිරීමයි.

14. කිසියම් භාණ්ඩයක සැපයුම වැඩිවීමට අනුලෝමව එහි ආන්තික පිරිවැය වැඩි වන අතර, එම භාණ්ඩයේ සැපයුම වැඩි කිරීම සඳහා නිෂ්පාදකයන් තවදුරටත් පෙළඹෙන්නේ,
    (1) එම භාණ්ඩය වෙත පනවා ඇති බද්ධ රජය විසින් පවත්වා ගෙන යන්නේ නම් පමණි.
    (2) ඉහළ යන ආන්තික ආවස්ථික පිරිවැයක් පවතින්නේ නම් පමණි.
    (3) භාණ්ඩය වෙත සහතික මිලක් ලබාදීමට රජය එකඟ වන්නේ නම් පමණි.
    (4) ඉහළ යන ආන්තික පිරිවැය ආවරණය වන සේ භාණ්ඩයේ මිල ඉහළ යන්නේ නම් පමණි.
    (5) නිෂ්පාදනය සම්බන්ධයෙන් රජය සීමා පනවන්නේ නැතිනම් පමණි.

15. එක්තරා පුද්ගලයකු භාණ්ඩයක් සඳහා කරන ඉල්ලුම ඔහුගේ ආදායම වෙනස්වන ප්‍රතිශතයකට අඩු ප්‍රතිශතයකින් අනුලෝම වශයෙන් වෙනස් කරයි නම්, එම භාණ්ඩය,
    (1) ගුණත්වයෙන් ඉහළ භාණ්ඩයකි. (2) ගිෆන් භාණ්ඩයකි.
    (3) අත්‍යවශ්‍ය භාණ්ඩයකි. (4) සුඛෝපභෝගී භාණ්ඩයකි.
    (5) බාල භාණ්ඩයකි.

16. x නමැති භාණ්ඩයේ මිල රු. 80.00 සිට 90.00 දක්වා ඉහළ වන විට y භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය ඒකක 1000 සිට 750 දක්වා අඩු වූයේ නම් x සහ y භාණ්ඩ අතර හරස් ඉල්ලුම් නම්‍යතාව කොපමණද?
    (1) 0.2 (2) -2.0 (3) 2.5 (4) -2.5 (5) -2.6

17. පහත සඳහන් ඉල්ලුම් වක්‍රයේ මිල රු. 25 දී ඉල්ලුම් නම්‍යතාව,
    (1) -0.5 කි.
    (2) 0.5 කි.
    (3) -1.0 කි.
    (4) 1.0 කි.
    (5) -2.0 කි.



18. කිසියම් භාණ්ඩයකට ඇති ඉල්ලුම අනම්‍ය නම් මුළු අයභාරයේ හැසිරීම සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
    (1) මිල වැඩි වන විට වැඩි වේ. (2) මිල අඩු වන විට වෙනස් නොවේ.
    (3) මිල වැඩිවුවහොත් නොවෙනස්ව පවතී. (4) මිල වැඩිවන විට අඩු වේ.
    (5) මිල කුමන දිශාවකට ගමන් කළද ස්ථාවරව පවතී.

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

19. වෙළඳපොලේ ඇති එක්තරා බිස්කට් වර්ගයක් සඳහා ඇති ඉල්ලුම සාපේක්ෂ වශයෙන් මිල නම්‍ය වේ යයි සිතන්න. මෙම භාණ්ඩයේ සැපයුමෙහි වැඩිවීමක් සිදුවුවහොත් ඇතිවන ප්‍රතිවිපාකය තෝරන්න.

(1) මුළු අයභාරය පහළ හෙළමින් මිල පහළ බසී.

(2) බිස්කට් සඳහා වෙළෙඳපොලේ අධි සැපයුමක් හට ගනී.

(3) බිස්කට් සඳහා වෙළඳපොළේ අධි ඉල්ලුමක් හටගනී.

(4) මිලෙහි සාපේක්ෂ වශයෙන් සුළු වැඩි වීමක් හටගන්නා නමුත් සමතුලිත ප්‍රමාණයෙහි වෙනසක් හට නොගනී.

(5) මුළු ආදායම ඉහළ නංවමින් භාණ්ඩයේ මිල පහළ බසී.

20. මෙම ඉල්ලුම් වක්‍රයට අදාළ වන ඉල්ලුම් සමීකරණය කුමක්ද?



(1) Qd = a - bp

(2) Qd = a + bp

(3) Qd = -a + bp

(4) Qd = a

(5) Qd = -a - bp

21. X භාණ්ඩයක සඳහා නම්‍ය ඉල්ලුමක් පවතින අතර එය සුඛෝපභෝගී භාණ්ඩයක්ද වේ. X භාණ්ඩය Y භාණ්ඩය සඳහා අනුපූරක භාණ්ඩයක් ද වේ නම්, පහත දැක්වෙන කවර ප්‍රකාශයක X භාණ්ඩය සම්බන්ධයෙන් නිවැරදි වේද?

	ඉල්ලුමේ මිල නම්‍යතාවය	ඉල්ලුමේ ආදායම් නම්‍යතාවය	ඉල්ලුමේ හරස් නම්‍යතාවය
(1)	-1.5	2.0	ඍණ
(2)	-0.8	0.8	ඍණ
(3)	-1.0	2.8	ධන
(4)	-0.5	0.3	ධන
(5)	-1.5	-2.0	ඍණ

22. පැකට් කරන ලද කිරි සඳහා වූ වෙළෙඳපොල සමතුලිතතාවෙහි පවතින්නේ යැයි සිතන්න. පැකට් කරන ලද කිරි සඳහා ඉල්ලුම වැඩි වෙමින් පවතින තත්ත්වයක් තුළ මෙම වෙළෙඳපොලෙහි දැකිය හැකි තත්ත්වයකි.

(1) මිල සහ ප්‍රමාණය යන දෙකම නොවෙනස්ව පැවතීම.

(2) මිල ඉහළ යන අතර අලෙවි ප්‍රමාණය අඩු වීම.

(3) මිල සහ ප්‍රමාණය යන දෙකම පහළ යාම.

(4) ප්‍රමාණය ඉහළ යන අතර මිල වෙනස්වීම අවිනිශ්චිත වීම.

(5) ආර්ථික අතිරික්තය වැඩි වීම.

23. සමතුලිත මිලට වඩා පහළ මිලක් නියම කරමින් පනවනු ලබන උපරිම මිල ප්‍රතිපත්තියක ප්‍රතිඵලයක් වන්නේ වෙළෙඳපොලෙහි,

(1) අධි සැපයුමක් හට ගැනීමයි.

(2) අධි ඉල්ලුමක් හට ගැනීමයි.

(3) සමතුලිත මිලක් ඇති වීමයි.

(4) සැපයුම වැඩිවීමයි.

(5) ඉල්ලුම අඩු වීමයි.

24. සීනි සඳහා දේශීය වෙළෙඳපොලේ පවත්නා ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පිළිවෙලින් පහත සමීකරණ වලින් පෙන්නුම් කරයි.

$$Qd = 320 - 3p \qquad Qs = -80 + 2p$$

මෙම වෙළෙඳපොලේ සීනි සැපයුම මත රු. 20/- ක ඒකක බද්දක් පැනවූයේ නම් සීනි වෙළෙඳපොළ බද්දට පෙර සමතුලිත මිල හා බද්දට පසු වෙළෙඳපොළ සමතුලිත මිල පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) පෙර සමතුලිත මිල රු. 88 වන අතර පසු සමතුලිත මිල රු. 80 වේ.
(2) පෙර සමතුලිත මිල රු. 104 වන අතර පසු සමතුලිත මිල 88 වේ.
(3) පෙර සමතුලිත මිල රු. 80 ක් වන අතර පසු සමතුලිත මිල රු. 88 වේ.
(4) පෙර හා පසු සමතුලිත මිල නොවෙනස්ව පවතී.
(5) පෙර සමතුලිත මිල රු. 75 වන අතර පසු සමතුලිත මිල රු. 88 වේ.

25. එක්තරා භාණ්ඩයක ඉල්ලුම් වක්‍රයේ හා සැපයුම් වක්‍රයේ සමීකරණ පහත දැක්වේ.

$$Qd = 60 - 2p$$
$$Qs = -10 + 3p$$

මෙම භාණ්ඩයේ එක් එක් ඒකකය මත රු. 5/- ක නිෂ්පාදන සහනාධාරයක් සපයන්නේ නම් සහනාධාරයෙන් පසු නිෂ්පාදකයාට ලැබෙන මිල (Ps) හා ගැනුම්කරුවන් ගෙවන මිල (Pb) නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

	නිෂ්පාදකයාට ලැබෙන මිල (Ps)	පාරිභෝගිකයා ගෙවන මිල (Pb)
(1)	14	09
(2)	12	17
(3)	15	20
(4)	14	19
(5)	16	11

26. අර්තාපල් සඳහා දේශීය වෙළෙඳ පොළේ පවත්නා ඉල්ලුම් හා සැපයුම් තත්ත්ව පහත සමිකරණ පෙන්නුම් කරයි.

$$Qd = 400 - 4p \qquad Qs = -100 + 6p$$

අර්තාපල් ඒකකයක ලෝක වෙළෙඳපොළ මිල රු. 40/- ක් වන අතර අර්තාපල් වෙළෙඳපොළ ජාත්‍යන්තර වෙළෙඳාමට විවෘත වන තත්ත්වයක් යටතේ අර්තාපල් සඳහා දේශීය ඉල්ලුම් හා සැපයුම් ප්‍රමාණයන් පිළිවෙලින්,

(1) ඒකක 240, 240 (2) ඒකක 200, 200 (3) ඒකක 240, 140
(4) ඒකක 140, 100 (5) ඒකක 100, 140

27. එක්තරා භාණ්ඩයකට අදාළ වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පහත රූප සටහනින් පෙන්නුම් කරයි.

මෙම භාණ්ඩ සඳහා නිෂ්පාදන සහනාධාරයක් ලබාදීමට රජය තීරණය කළහොත් ඒකක සහනාධාරය බෙදී යන්නේ,

(1) නිෂ්පාදකයා සහ පාරිභෝගිකයා අතර සමාන ලෙසයි.
(2) නිෂ්පාදකයාට වැඩි ප්‍රමාණයක් හා පාරිභෝගිකයාට අඩු ප්‍රමාණයක් ලෙසයි.
(3) සම්පූර්ණ සහනාධාරයම නිෂ්පාදකයාට හිමිවන ලෙසයි.
(4) සම්පූර්ණ සහනාධාරයම පාරිභෝගිකයාට හිමිවන ලෙසයි.
(5) සහනාධාරයෙන් වැඩි ප්‍රමාණයක් පාරිභෝගිකයාට හිමිවන ලෙසයි.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

28. රජයේ මිලදී ගැනීම සහිත මිල ආධාරක ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වන භාණ්ඩයකට අදාළ තොරතුරු පහත රූප සටහනේ පෙන්නුම් කරයි. අතිරික්ත සැපයුම රජය මිලදී ගැනීමට දරණ පිරිවැය,



(1) රු. 1000 කි.
(2) රු. 1200 කි.
(3) රු. 1500 කි.
(4) රු. 250 කි.
(5) රු. 3000 කි.

29. එක්තරා නිෂ්පාදන ආයතනයක් සතු නිෂ්පාදන යෙදවුම් පහත පරිදි වේ. ඒ අතරින් කෙටි කාලයේ දී ස්ථාවරව පවතින සාධකය ලෙස හඳුනාගත හැකි වන්නේ,

(1) භාවිතයට ගත් විදුලි ඒකක සංඛ්‍යාව
(2) ආයතනය පිහිටි ස්ථානය
(3) ශ්‍රම පැය ගණන
(4) භාවිතාකළ අමුද්‍රව්‍ය ප්‍රමාණය
(5) කාර්යාල ප්‍රයෝජනය සඳහා වූ ලිපි ද්‍රව්‍ය ප්‍රමාණය.

30. නිෂ්පාදන ආයතනය සතුව ආරෝපිත පිරිවැයක් පවතින විට,

(1) ගණකාධිකාරී ලාභය සෑම විටම ශුන්‍ය වේ.
(2) ආර්ථික ලාභය හා ගණකාධිකාරී ලාභය එකිනෙකට සමාන වේ.
(3) ආර්ථික ලාභයට වඩා ගණකාධිකාරී ලාභය විශාල වනු ඇත.
(4) ගණකාධිකාරී ලාභයට වඩා ආර්ථික ලාභය විශාල වනු ඇත.
(5) ආර්ථික ලාභය සෑම විටම ශුන්‍ය අගයක් ගනී.

31. පූර්ණ තරඟකාරී හා ඒකාධිකාරී තරඟය යන වෙළෙඳපොළ ව්‍යුහයක් සඳහා අදාළ වන උපකල්පන නිවැරදිව ඇතුළත් වන වරණය කුමක්ද?

	පූර්ණ තරඟය	ඒකාධිකාරී තරඟය
(1)	නිෂ්පාදිතය ප්‍රභේදනය වීම.	නිෂ්පාදිතය සමජාතීය වීම.
(2)	විකුණුම්කරුවන් විශාල සංඛ්‍යාවක් සිටීම.	විකුණුම්කරුවන් සුළු සංඛ්‍යාවක් සිටීම.
(3)	ප්‍රවේශය අබාධ වීම හා පිටවීම බාධාකාරී වීම.	ප්‍රවේශය හා පිටවීම බාධාකාරී වීම.
(4)	තොරතුරු ලබා ගැනීමේ දුෂ්කරතා පැවතීම.	පූර්ණ තොරතුරු පැවතීම.
(5)	සමජාතීය භාණ්ඩ නිෂ්පාදනය වීම.	නිෂ්පාදිත ප්‍රභේදනය වීම.

32. හීනවල ඵලදා නීතිය යනු,

(1) නිෂ්පාදන ආයතනයක් ස්ථාවර යෙදවුම් ප්‍රමාණයක් සමඟ විචල්‍ය යෙදවුම් වැඩිකරමින් නිෂ්පාදනය වැඩිකරන විට එක්තරා අවස්ථාවකින් පසු එහි ආන්තික ඵලදාව ක්‍රමයෙන් පහළ වැටෙන බවයි.
(2) නිෂ්පාදන ආයතනයක් එහි විචල්‍ය යෙදවුම් ප්‍රමාණයක් සමඟ ස්ථාවර යෙදවුම් වැඩිකරමින් නිෂ්පාදනය වැඩිකරන විට එක්තරා අවස්ථාවකින් පසු ආන්තික ඵලදාව ක්‍රමයෙන් පහළ වැටෙන බවයි.
(3) කර්මාන්ත ශාලාවේ විශාලත්වය වැඩි කරන විට එහි ආන්තික ඵලදාව ක්‍රමයෙන් පහළ වැටෙන බවයි.
(4) කර්මාන්ත ශාලාවේ විශාලත්වය වැඩිකරන විට එහි ආන්තික හා සාමාන්‍ය පිරිවැය ක්‍රමයෙන් පහළ වැටෙන බවයි.
(5) නිෂ්පාදන ආයතනය ස්ථාවර යෙදවුම් ප්‍රමාණයක් සමඟ විචල්‍ය යෙදවුම් වැඩිකරමින් නිෂ්පාදනය වැඩිකරන විට, එක්තරා අවස්ථාවකින් පසු එහි සාමාන්‍ය පිරිවැය පහළ වැටෙන බවයි.

33. එක්තරා ආයතනයක නිමවුම ශුන්‍ය වන විට එහි මුළු පිරිවැය රුපියල් 500.00 ක් වන අතර ඒකක 5 ක් නිෂ්පාදනය කිරීමේ මුළු පිරිවැය රු. 740.00 ක් වන්නේ නම්, ඒකක 5 ක් නිෂ්පාදනය කිරීමේ සාමාන්‍ය විචල්‍ය පිරිවැය වන්නේ,

(1) රුපියල් 248 (2) රුපියල් 240 (3) රුපියල් 160
(4) රුපියල් 100 (5) රුපියල් 48

34. ලාභ උපරිම කිරීම අරමුණු කරගත් පූර්ණ තරඟකාරී ආයතනයක් කෙටි කාලීන පාඩු අවම කරගැනීම සඳහා නිෂ්පාදන ආයතනය වසා දැමීමට තීරණය කරනුයේ පහත සඳහන් කවර තත්ත්වයකදී ද?

(1) සාමාන්‍ය අයභාරය, සමාන්‍ය මුළු පිරිවැයට වඩා අඩු වූ විට දී ය.
(2) ආන්තික පිරිවැය, ආන්තික අයභාරයට වඩා අඩු වූ විට දී ය.
(3) සාමාන්‍ය අයභාරය, සමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා අඩු වූ විට දී ය.
(4) මුළු අයභාරය, මුළු පිරිවැයට වඩා අඩු වූ විටදී ය.
(5) ආන්තික පිරිවැය, සාමාන්‍ය මුළු පිරිවැයට වඩා වැඩි වූ විට දී ය.

35. පහත සඳහන් කර්මාන්ත අතරින් වඩාත් ඒකාධිකාරී තරඟයෙහි ලක්ෂණ පවත්නා කර්මාන්තය වන්නේ,

(1) රූපවාහිනී විකාශනය (2) රූපලාවන්‍යාගාර (3) ටයර් නිෂ්පාදනය
(4) ප්‍රවෘත්තිපත්‍ර (5) සිමෙන්ති නිෂ්පාදනය

36. කතිපයාධිකාරී වෙළෙඳපොළක අවශ්‍යම ලක්ෂණයක් ලෙස හඳුනා ගැනීමට හැකි වන්නේ,

(1) මහා පරිමාණ නිෂ්පාදකයන් අතළොස්සක් පමණක් සිටීම.
(2) ආයතන අතර මිල මත පදනම් වූ එකඟතාවයන් දක්නට නොහැකිවීම.
(3) සුවිශේෂි වූ නිෂ්පාදන බිහි කිරීම.
(4) ආයතනය සහ වෙළෙඳපොළ හැසිරීම සමාන වන අතර විශේෂිත වූ භාණ්ඩ නිෂ්පාදනය කිරීම.
(5) වෙළෙඳපොළ අබාධ පිටවීම හා අබාධ ප්‍රවේශය.

37.



කිසියම් ආර්ථිකයක් කෙටිකාලයේදී A ලක්ෂයේ සිට B ලක්ෂ්‍යය දක්වා ගමන් කරන ප්‍රතිගමනාත්මක අදියරේ දී සිදුවිය හැකි ප්‍රතිවිපාක දෙකක් වන්නේ,

(1) ඉල්ලුම අඩුවීම හා විරැකියාව අඩුවීමයි.
(2) නිමැවුම පහළයාම හා සේවා නියුක්තිය අඩු වීමයි.
(3) ව්‍යාපාරික විශ්වාසනීයත්වය වර්ධනය වීම හා ආයෝජන ඉහළ යාමයි.
(4) විරැකියාව අඩුවීම හා නිමැවුම ඉහළ යාමයි.
(5) ජාතික ආදායම ඉහළ යාම හා කුඩා ව්‍යාපාර වර්ධනය වීමයි.

38. පහත සඳහන් කවර ක්‍රියාකාරකමක් නිෂ්පාදන ඉමෙන් බැහැර කෙරේද?
   (1) වැටුප් ලබන සේවකයන් විසින් ඉටු කරනු ලබන ගෘහ සේවා.
   (2) තමන් පදිංචි වී සිටින නිවාසවලින් ලැබෙන නේවාසික සේවය.
   (3) තම ගෙවත්තේ එළවළු වගා කිරීම.
   (4) තම නිවස පිරිසිදු කිරීම හා අලංකාර කිරීම.
   (5) වනාන්තර වලින් ආහාර භෝග හා පළතුරු එක්රැස් කිරීම.

39. රටක යම් වර්ෂයක නාමික දළ දේශීය නිෂ්පාදිතය රු. බිලියන 1000 ක් ද දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය 125 ක් ද බවත් සලකන්න. මෙම රටේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ අගය කොපමණද?
   (1) රු. බිලියන 80
   (2) රු. බිලියන 800
   (3) රු. බිලියන 1000
   (4) රු. බිලියන 1050
   (5) රු. බිලියන 1200

40. පහත සඳහන් කවරක් ප්‍රාථමික ආදායමේ සංරචක වලට අයත් **නොවේද?**
   (1) දළ මිශ්‍ර ආදායම
   (2) නිෂ්පාදනය හා ආනයන මත ශුද්ධ බදු
   (3) සේවක ආදායම්
   (4) ශුද්ධ විදේශ ප්‍රාථමික ආදායම
   (5) දළ මෙහෙයුම් අතිරික්තය

41. 2022 වර්ෂයේ ශ්‍රී ලංකාවේ වෙළඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය හා ඒක පුද්ගල දළ ජාතික ආදායම නිවැරදිව දැක්වෙන සංයෝගය කුමක් ද?

	වෙළඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය (එ.ජ.ඩො. බිලියන)	ඒක පුද්ගල දළ ජාතික ආදායම (එ.ජ.ඩොලර්)
(1)	94.4	4290
(2)	92.4	3968
(3)	86.5	3867
(4)	76.2	3378
(5)	72.1	3260

42. දළ දේශීය වියදමට ගෙවුම් තුලන ලේඛනයේ වර්තන ගිණුමේ ශේෂය ගැළපූ විට ලැබෙනුයේ,
   (1) දළ දේශීය නිෂ්පාදිතය මත වියදමයි.
   (2) දළ දේශීය ආදායමයි.
   (3) ශුද්ධ ජාතික නිෂ්පාදිතයයි.
   (4) වැය කළ හැකි දළ ජාතික ආදායමයි.
   (5) ජාතික ඉතුරුම් වටිනාකමයි.

43. වියදම් ප්‍රවේශය මත රටක දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේදී පහත සඳහන් කවරක් දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනයේ සංරචකයක් වශයෙන් ගණනය කවරේද?
   (1) පෞද්ගලික පරිභෝජනය සඳහා මිලදී ගත් අලුත් මෝටර් රථයක්.
   (2) සමාගමක කොටස්
   (3) තේක්ක වගාව කළ ඉඩම්
   (4) රට තුළ සිටින සියලුම අස්වැසුම ලාභීන්ට ගෙවන රු. 5 000 ක දීමනාවක්.
   (5) ව්‍යාපාරිකයෙක් පෞද්ගලික බැංකුවකින් ලබා ගන්නා ණය මුදලක්.

44 කල්පිත ආර්ථිකයක් සඳහා පහත සඳහන් දත්ත ඔබට ලබා දී ඇත.

භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයන	=	රු.බි.	400
භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයන	=	රු.බි.	600
දේශීය ඉතුරුම්	=	රු.බි.	500
විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම	=	රු.බි.	200
විදේශ ශුද්ධ ජංගම සංක්‍රාම	=	රු.බි.	300

මෙම තොරතුරු වලට අනුව මෙම ආර්ථිකයෙහි දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය හා ජාතික ඉතුරුම් අගයන් පිළිවෙලින් දැක්වෙන පිළිතුර කුමක්ද?

(1) රු.බි. 1000 ක් සහ රු.බි. 1500 ක් වේ.
(2) රු.බි. 800 ක් සහ රු.බි. 1200 ක් වේ.
(3) රු.බි. 700 ක් සහ රු.බි. 1000 ක් වේ.
(4) රු.බි. 650 ක් සහ රු.බි. 1000 ක් වේ.
(5) රු.බි. 500 ක් සහ රු.බි. 800 ක් වේ.

45. ස්වායත්ත පරිභෝජනය රුපියල් මිලියන 600 ක් හා ආන්තික පරිභෝජන නැමියාව (MPC) 0.8 ක් වන කිසියම් ආර්ථිකයක සමාහාර පරිභෝජන ශ්‍රිතය රූප සටහන මගින් පෙන්නුම් කෙරේ.



වැය කළ හැකි දළ ජාතික ආදායම රුපියල් මිලියන 2000 සිට 3000 දක්වා වැඩිවේ නම් ආන්තික පරිභෝජන නැමියාවට (MPC) සහ සාමාන්‍ය පරිභෝජන නැමියාවට (APC) කුමක් සිදුවේද?

	MPC	APC
(1)	ඉහළ නගී.	ඉහළ නගී.
(2)	ඉහළ නගී.	පහළ වැටේ.
(3)	නොවෙනස්ව පවතී.	ඉහළ නගී.
(4)	පහළ වැටේ.	ඉහළ නගී.
(5)	නොවෙනස්ව පවතී.	පහළ වැටේ.

46. කිසියම් ආර්ථිකයක සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ හැසිරීම පහත දැක්වෙන රූප සටහන පෙන්නුම් කරයි.



මෙම ආර්ථකයේ සමාහාර වියදම් ශ්‍රිතය AE_1 සිට AE_2 දක්වා ඉහළට විතැන්වීමට හේතුවිය හැක්කේ පහත සඳහන් කවර සිදුවීමක්ද?

(1) වෙළඳ ශේෂයේ හිඟයක්.
(2) ආන්තික පරිභෝජන නැමියාවේ වැඩිවීමක්.
(3) ශුද්ධ බදු ඉහළයාමක්.
(4) අයවැය ලේඛනයේ හිඟයක්.
(5) කුටුම්භ ඉතුරුම් වැඩිවීමක්.

47. ආන්තික ඉතුරුම් නැමියාව (MPS) 0.25 ක් ද, ස්වාධීන පරිභෝජනය (a) රු. 400 ක් ද වන සරල ආර්ථිකයක වැය කළ හැකි ආදායම (Yd) රු. 1200 න් ඉහළ ගියහොත් පරිභෝජන වියදම (c) වැඩි වනුයේ,

(1) රුපියල් 1100 කිනි.
(2) රුපියල් 1000 කිනි.
(3) රුපියල් 900 කිනි.
(4) රුපියල් 700 කිනි.
(5) රුපියල් 300 කිනි.

48. එක්තරා කල්පිත ආර්ථිකයකට අදාළ සාර්ව ආර්ථික දත්ත පෙළක් පහත වගුව පෙන්නුම් කරයි.

අයිතමය	රු. මිලියන
ඉතුරුම්	300
ආයෝජනය	260
බදු අයකිරීම්	800
ශුද්ධ අපනයන	- 110
ආණ්ඩුවේ මිලදී ගැනීම්	950

ඉහත තොරතුරු වලට අනුව මෙම ආර්ථිකයට අදාළ නිවැරදි ප්‍රකාශය කවරක්ද?

(1) අයවැය අතිරික්තයක් පවතී.
(2) ආර්ථිකය සමතුලිතතාවේ පවතී.
(3) කාන්දුවීම් විදීම්වලට වඩා අඩු ය.
(4) කාන්දුවීම් විදීම්වලට වඩා වැඩි ය.
(5) ආර්ථිකය සංකෝචනය වනු ඇත.

49. ගුණකයේ වටිනාකම ප්‍රසාරණය කිරීමට හේතුවන සාධකය මින් කුමක්ද?

(1) ආන්තික ඉතුරුම් නැමියාව වැඩිවීම.
(2) ආන්තික පරිභෝජන නැමියාව වැඩිවීම.
(3) ආණ්ඩුවේ වියදම් අඩුවීම.
(4) පරිභෝජන වියදම අඩුවීම.
(5) අපනයන පරිමාව අඩුවීම.

50. ආන්තික පරිභෝජන නැමියාව (MPC) 0.9 ක්ව පවතින ආර්ථිකයක ආණ්ඩුවේ බදු රුපියල් මිලියන 100 කින් හා රාජ්‍ය වියදම් රු.මි. 180 න් වැඩි කරනු ලැබුවහොත් මෙම ආර්ථිකයේ මුළු නිමැවුම කොපමණ ප්‍රමාණයකින් වෙනස් වේද?

(1) රුපියල් මිලියන 2700 කින් ප්‍රසාරණය වේ.
(2) රුපියල් මිලියන 1800 කින් ප්‍රසාරණය වේ.
(3) රුපියල් මිලියන 900 කින් ප්‍රසාරණය වේ.
(4) රුපියල් මිලියන 900 කින් සංකෝචනය වේ.
(5) රුපියල් මිලියන 100 කින් සංකෝචනය වේ.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2024
Third Term Test - Grade 12 - 2024

විභාග අංකය: ....

ආර්ථික විද්‍යාව - II

කාලය පැය 03 යි

(කියවීමට අමතර කාලය වි. 10 යි.)

උපදෙස්

- 'අ' උපකොටසේ අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද, 'ආ' උපකොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(''අ'' - උප කොටස)

01 (i) ''නොමිල භාණ්ඩ යනු ආර්ථික භාණ්ඩමය'' යන ප්‍රකාශය සත්‍ය වේද? පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) සාධක ඵලදායිතාව අර්ථ දක්වා, එය තීරණය කරන ප්‍රධාන සාධක දෙකක් නම් කරන්න.(ලකුණු 04)

(iii) පරිගණක හා රූපවාහිනී නිපදවන ආර්ථිකයක් උපකල්පනය කරන්න. නිපදවනු ලබන සෑම පරිගණකයක් වෙනුවෙන් රූපවාහිනි යන්ත්‍ර 2 ක් කැප කරන්නේ යැයි ද සිතන්න.

(අ) ඔබගේ සංඛ්‍යා යොදා ගනිමින් නිෂ්පාදන හැකියා ලේඛනයක් ගොඩ නංවා ඊට අදාළ නිෂ්පාදන හැකියාව රූප සටහනක දක්වන්න. (ලකුණු 02)

(ආ) ඉහත අඳින ලද නිෂ්පාදන හැකියා වක්‍රයේ විශේෂිත හැඩයට හේතු දක්වන්න. (ලකුණු 03)

(iv) සානුබලවල ස්වභාවය මත ආර්ථික පද්ධති වර්ග කරන ආකාරය සැකෙවින් දක්වන්න. (ලකුණු 03)

(v) මිශ්‍ර ආර්ථික ක්‍රමයක් රටකට වඩා වාසිදායක වේ. පැහැදිලි කරන්න. (ලකුණු 04)

02 (i) සාමාන්‍ය භාණ්ඩයක් සම්බන්ධයෙන් ඉල්ලුම් නීතිය ක්‍රියාත්මක වන්නේ කෙසේද? (ලකුණු 02)

(ii) සාමාන්‍ය භාණ්ඩ, බාල භාණ්ඩ සහ ගිෆන් භාණ්ඩ එකිනෙකින් වෙනස්වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iii) කිසියම් භාණ්ඩයක් සඳහා ඇති වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් වක්‍රවලට අදාළ සමීකරණ පහත දැක්වේ.

$$Qd = 120 - 20p \quad \text{(ඉල්ලුම)}$$

$$Qs = -30 + 10p \quad \text{(සැපයුම)}$$

(අ) මෙම භාණ්ඩයෙහි සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කර, එය ප්‍රස්තාර සටහනක නිරූපණය කරන්න. (ලකුණු 04)

(ආ) සමතුලිතයේදී පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදක අතිරික්තය ගණනය කරන්න. (ලකුණු 04)

(iv) ''අන් සාධක ස්ථාවරව තිබියදී, භාණ්ඩයක මිල එහි සැපයුම් ප්‍රමාණයෙහි ධන (+) ශ්‍රිතයක් වේ.''

(අ) මෙහි අන් සාධක යන්නෙන් අදහස් වන්නේ මොනවාද? (ලකුණු 03)

(ආ) භාණ්ඩයක සැපයුම් ප්‍රමාණය එම භාණ්ඩයේ මිලෙහි ධන (+) ශ්‍රිතයක් වන්නේ ඇයි? (ලකුණු 04)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

03 (i) ඉල්ලුම් නීතියට පටහැනි අවස්ථා 03 ක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) පාන් සඳහා වන ඉල්ලුමේ මිල නම්‍යතාව -0.5 ක් බව පර්යේෂණයකින් හෙළි වී ඇත. වර්තමානයේ පාන් රාත්තලක මිල රු. 120.00 ක් වේ. පාන් පරිභෝජනය 20% කින් අඩු කිරීමට රජයට අවශ්‍ය වී ඇත්නම්, ඒ සඳහා පාන් මිල කොතරම් ප්‍රමාණයක් විය යුතුද? (ලකුණු 04)

(iii) මිල නොවන ඕනෑම සලාකන ක්‍රම තුනක් (03 ක්) නම් කොට, ඒවා සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 06)

(iv) කිසියම් භාණ්ඩයක මිල පහළ යන විට, පාරිභෝගිකයන් එම භාණ්ඩයෙන් වැඩියෙන් ඉල්ලුම් කරන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

(v) වෙළෙඳපොළ සමතුලිතයක දැකිය හැකි ලක්ෂණ නම් කරන්න. (ලකුණු 03)

04 (i) ඒකක සහනාධාර යන්නෙන් කුමක් අදහස්වේද? (ලකුණු 02)

(ii) තරඟකාරී වෙළෙඳපොළක අලෙවි කෙරෙන භාණ්ඩයකට අදාළ පහත සමීකරණ භාවිත කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

$Qd = 500 - 50p$ (ඉල්ලුම් සමීකරණය) $Qs = 100 + 50p$ (සැපයුම් සමීකරණය)

(අ) සමතුලිත මිල හා ප්‍රමාණය රූප සටහනකින් පෙන්නුම් කරන්න. (ලකුණු 02)

(ආ) මෙම භාණ්ඩ සඳහා රජය රු. 2.00 ක සහනාධාරයක් ලබා දුන්නේ නම් නව සමතුලිත මිල හා ප්‍රමාණය කොපමණද? ඉහත රූප සටහනේ දක්වන්න. (ලකුණු 02)

(ඉ) රජයට වැය වන සහනාධාර වියදම කොපමණද? (ලකුණු 02)

(ඊ) සහනාධාරය නිසා අහිමිවන සමාජ ශුභසාධනය (Dead weight Social loss) කොපමණද? (ලකුණු 04)

(iii) වෙළෙඳපොලට රජය මැදිහත් වී ඒකක බද්දක් පනවන්නේ යැයි සිතන්න. ඒකක බදු පැනවීම නිසා පහත දැක්වෙන තත්වයන් ඇතිවන්නේ කවර ඉල්ලුම් නම්‍යතාවකදී ද? රූප සටහන් යොදා ගනිමින් පිළිතුර පැහැදිලි කරන්න.

(අ) බදු බර වැඩියෙන් පාරිභෝගිකයා වෙත පතිත වීම.

(ආ) බදු බර වැඩියෙන් නිෂ්පාදකයා වෙත පතිත වීම. (ලකුණු 04)

(iv) භාණ්ඩයකට නිෂ්පාදන බද්දක් පැනවූ විට සැපයුම් වක්‍රයෙහි කිසිදු වෙනසක් සිදු නොවන්නේ නම් බද්දෙන් පසු නිෂ්පාදක අතිරික්තයට වන බලපෑම රූප සටහනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

05 (i) රජය විසින් අර්තාපල් වගාකරන ගොවීන්ට කිලෝග්‍රෑමයක් සඳහා රු. 100 ක මිල ආධාරකයක් ලබා දී ඇති අතර අතිරික්ත සැපයුම ආධාරක මිල යටතේ රජය විසින් මිලදී ගන්නා බවත් සලකන්න. වෙළඳපොළ ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත දැක්වේ.

$Qd = 240 - 2p$ $Qs = -210 + 3p$

(a) මෙම මිල ආධාරක වැඩසටහන නිසා වෙළෙඳපොළ පාරිභෝගික ඉල්ලුම් ප්‍රමාණය හා නිෂ්පාදකයාගේ සැපයුම් ප්‍රමාණය සොයන්න. (ලකුණු 02)

(b) රජයේ මිල දී ගැනීමට පෙර පාලන මිල නිසා හටගන්නා වෙළෙඳපොළ අධි සැපයුම් ප්‍රමාණය සොයන්න. (ලකුණු 01)

(c) මිල ආධාරක වැඩ සටහන යටතේ රජයේ පිරිවැය ගණනය කරන්න. (ලකුණු 01)

(d) මිල ආධාරකය නිසා අහිමිවන ශුභ සාධනය ප්‍රස්තාර සටහනක් ඇසුරින් ගණනය කරන්න. (ලකුණු 04)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

(ii) කුකුළු මස් සඳහා රජය උපරිම මිලක් නියම කිරීමට කටයුතු කරන ලදී. කුකුළු මස් සඳහා උපරිම මිලක් නියම කිරීමේ ආර්ථික ප්‍රතිවිපාක කවරේද? (ලකුණු 04)

(iii) ප්‍රාථමික භාණ්ඩවල මිල ස්ථායිකරණය හා ගොවීන්ගේ ආදායම් ස්ථාවරත්වයට ගෙන ඒම සඳහා රජය භාවිත කරන උපක්‍රම කවරේද? (ලකුණු 04)

(iv) උපරිම මිල නියම කිරීම සාර්ථක කර ගැනීමට රජයට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග කවරේද? (ලකුණු 04)

06 (i) ''අඩුවන පරිමාණානුකූල'' ඵල සහ විචල්‍ය සාධකයක ''හීනවන ඵල අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(ii) පූර්ණ තරඟය සහ ඒකාධිකාරී තරඟය යන වෙළෙඳපල තත්ත්ව අතර දැකිය හැකි සමානකම් 2 ක් සහ අසමානකම් දෙකක් දක්වන්න. (ලකුණු 04)

(iii) නිෂ්පාදන ආයතනයක සාමාන්‍ය මුළු පිරිවැය සහ සාමාන්‍ය විචල්‍ය පිරිවැය කෙරෙහි පහත දී ඇති සිද්ධීන් බලපානුයේ කෙසේදැයි දක්වන්න.

(අ) ඉන්ධන මිල පහළ යාමක්.

(ආ) සේවක වැටුප් අනුපාතිකයේ ඉහළ යාමක්.

(ඉ) ආයතනය ලබා ගත් ණය සඳහා වූ පොළිය 3% කින් ඉහළ දැමීම.

(ඊ) ආයතනයේ ප්‍රධාන විධායක නිළධාරියාගේ වේතනයේ ඉහළ යාමක්. (ලකුණු 04)

(iv) මාසික ආදායම රු. 100 000/- උපයමින් සිටි එක්තරා බැංකු සේවිකාවක් තමන්ගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ අරමුණින් සත්ත්ව කෑම අලෙවිහලක් ආරම්භ කර, මසකට රු. 250 000/- ක ආදායමක් උපයමින්, තම ව්‍යාපාරය සාර්ථකව පවත්වාගෙන යන්නී ය.

(අ) සාංක්‍රාම ඉපයීම හා ආර්ථික බදු කුලිය නිර්වචනය කොට මෙම සංකල්ප දෙක අතර වෙනස සුදුසු රූප සටහනක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ආ) මෙම ව්‍යාවසායිකාවගේ සංක්‍රාම ඉපයීම කොපමණ වේද? (ලකුණු 02)

(ඉ) මෙම ව්‍යවසායිකාව ආර්ථික බදු කුලියක් උපයන්නේද? ඉහත ලබා දී ඇති තොරතුරු ආශ්‍රයෙන් ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 02)

07 (i) නිෂ්පාදන ආයතනයක ලාභය ගණනය කිරීමේදී ප්‍රධාන වශයෙන් ගිණුම්කරණ ප්‍රවේශය හා ආර්ථික ප්‍රවේශය වශයෙන් ක්‍රමවේදයන් දෙකක් ඔස්සේ ගණනය කළ හැක. ඒ අනුව ''ගිණුම්කරණ ලාභය'' හා ''ආර්ථික ලාභය'' අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) වෙළඳපොලක අලෙවි වන විවිධ වූ භාණ්ඩ හා සේවා ප්‍රධාන වූ වෙළෙඳපොල ව්‍යුහයන් කිහිපයකට වර්ග කල හැක. මේ අතරින් කතිපයාධිකාර වෙළඳපොළ, ඒකාධිකාරි වෙළඳපොළ ව්‍යුහයෙන් වෙනස් වන්නේ කෙසේදැයි සැකවින් දක්වන්න. (ලකුණු 04)

(iii) නිෂ්පාදන ආයතයක දිගු කාලීන නිෂ්පාදන ක්‍රියාවලියෙහි ප්‍රතිඵලයක් ලෙස ආර්ථික පිරිමැසුම් මෙන්ම ආර්ථික නොපිරිමැසුම් ද ඇතිවිය හැක. ආර්ථික පිරිමැසුම් හා ආර්ථික නොපිරිමැසුම් ඇතිවීමට හේතු මොනවාද? (ලකුණු 06)

(iv) පූර්ණ තරඟකාරී වෙළෙඳපොළක් තුල අලාභ ලබමින් සිටින නමුත් අනාගතයේ මිල වැඩිවීම හේතුවෙන් ලාභ ඉපයීමේ අපේක්ෂාවෙන් ආයතනය වසා නොදමා තව දුරටත් එම නිෂ්පාදන මට්ටමම පවත්වාගෙන යාමට කටයුතු කරන නිෂ්පාදන ආයතනයක සාමාන්‍ය මුළු පිරිවැය, සාමාන්‍ය විචල්‍ය පිරිවැය හා ආන්තික පිරිවැය වක්‍රවල හැසිරීම රූප සටහනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

08 (i) ජාතික ගිණුම්කරණයේ ආදායම් ප්‍රවේශයේ සංරචකයන් වන දළ මෙහෙයුම් අතිරික්තය හා මිශ්‍ර ආදායම කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)

(ii) ''ආර්ථික ප්‍රදේශය'' යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 03)

(iii) නිෂ්පාදන ක්‍රියාවලියේදී භාවිතාවන ''අතරමැදි යෙදවුම්'' හා ''ප්‍රාථමික යෙදවුම්'' අතර වෙනස පෙන්වා දෙන්න. (ලකුණු 04)

(iv) කල්පිත ආර්ථිකයක ජාතික ගිණුම් පිළිබඳ පහත දත්ත ඔබට සපයා ඇත.

අයිතමය	(වටිනාකම රු. බිලියන)
පෞද්ගලික පරිභෝජන වියදම	15000
රාජ්‍ය පරිභෝජන වියදම	12000
ආයෝජනය	10000
අපනයන	5000
ආනයන	3500
විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම	-1000
විදේශ ශුද්ධ ද්විතියික ආදායම	1500
ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය	800

ඉහත දත්ත ඇසුරින් පහත දෑ ගණනය කරන්න.

(a) දළ දේශීය වියදම (ලකුණු 02)

(b) දළ දේශීය නිෂ්පාදිතය (ලකුණු 02)

(c) ශුද්ධ ජාතික ආදායම (ලකුණු 02)

(v) කිසියම් ආර්ථිකයක ස්වායත්ත පරිභෝජනය රුපියල් මිලියන 500 ක් ද ආන්තික ඉතුරුම් නැමියාව 0.25 ක් ද වේ යැයි සලකන්න.

(අ) මෙම ආර්ථිකයේ පරිභෝජන ශ්‍රිතය ගොඩනගන්න. (ලකුණු 02)

(ආ) මෙම ආර්ථිකයේ ආයෝජනය රු. මිලියන 100 ක් ද රාජ්‍ය වියදම රු. මිලියන 180 ක් ද නම් සමතුලිත ජාතික ආදායම ගණනය කරන්න. (ලකුණු 03)

09 (i) පහත දැක්වෙන පාර්ශව, ජාතික ගිණුම්කරණයේදී සැලකෙනුයේ නේවාසික ලෙස ද, අනේවාසික ලෙස ද යන්න දක්වන්න.

(a) මැදපෙරදිග රටක ගෘහ සේවයේ යෙදෙන ශ්‍රී ලාංකිකයෙක්.

(b) ඇමරිකා එක්සත් ජනපදයේ විශ්ව විද්‍යාලයක වසර 04 ක කාලයක සිට අධ්‍යාපනය ලබමින් සිටින ශ්‍රී ලාංකීක ශිෂ්‍යයෙක්.

(c) ශ්‍රී ලංකාවේ රෝහලක වසර 06 ක කාලයක් සේවය කරමින් සිටින ඉන්දියානු වෛද්‍යවරයෙක්.

(d) මෙරට පිහිටි රුසියානු තානාපති කාර්යාලයේ සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයින්. (ලකුණු 04)

(ii) කිසියම් අවස්ථාවක රටක දළ ජාතික ආදායම එම රටේ දළ දේශීය නිෂ්පාදිතයට වඩා ඉහළ අගයක් ගනු ලැබීමට හේතුව කුමක්ද? (ලකුණු 02)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(iii) කල්පිත ආර්ථිකයක් සඳහා පහත සඳහන් දත්ත ඔබට සපයා ඇත.
(සියලුම අගයන් රුපියල් බිලියන වලිනි.)

සේවක ආදායම්	3000
දළ මෙහෙයුම් අතිරික්තය	5000
ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය	1000
නිෂ්පාදනය මත වෙනත් ශුද්ධ බදු	100
දළ දේශීය නිෂ්පාදිතය	15000
විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම	-200
විදේශ ශුද්ධ ද්විතියික ආදායම	500
මිශ්‍ර ආදායම	6000

ඉහත දත්ත ඇසුරින් පහත සඳහන් දෑ ගණනය කරන්න.

(a) මූලික මිලට දළ එකතු කළ අගය (ලකුණු 02)

(b) නිෂ්පාදිතය මත ශුද්ධ බදු (ලකුණු 02)

(c) දළ ජාතික ආදායම (ලකුණු 02)

(d) වැයකළ හැකි ශුද්ධ ජාතික ආදායම (ලකුණු 02)

(iv) විවෘත ආර්ථිකයක සාර්ව ආර්ථික සමතුලිතය ආදායම් වියදම් ප්‍රවේශය සහ විදීම් කාන්දුවීම් ප්‍රවේශයට අදාළ රූප සටහන් යොදා ගනිමින් පෙන්නුම් කරන්න. (ලකුණු 04)

(v) ආන්තික පරිභෝජන නැඹියාව 0.75 ක් වන ආර්ථිකයක ස්වායත්ත බදු රුපියල් මිලියන 50 කින් වැඩි කිරීම සමතුලිත ජාතික ආදායම කෙරෙහි කෙබඳු බලපෑමක් ඇති කරයිද? (ලකුණු 02)

10 (i) ''දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේදී පැන නගින ප්‍රධාන ගැටලුවක් වන්නේ බහුගණන දෝෂයයි'' බහුගණන දෝෂය යනු කුමක්ද? එය නිවැරදි කර ගත හැක්කේ කෙසේද? (ලකුණු 04)

(ii) කිසියම් ආර්ථික නිශ්චිත කාල පරිච්ඡේදයක් තුළ සමස්ත නිෂ්පාදන ක්‍රියාවලිය, නිෂ්පාදන, ආදායම හා වියදම යන ප්‍රවේශ ඔස්සේ මිනුම් කළ විට එකම වටිනාකමක් ලබා දෙන්නේ ඇයි ? (ලකුණු 03)

(iii) නිෂ්පාදන ඉමට ඇතුළත් නොවන ආර්ථික කටයුතු 03 ක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iv) ස්වාධීන පරිභෝජන වියදම හා පෙළඹුණු පරිභෝජන වියදම අතර වෙනස පෙන්වා දෙන්න. (ලකුණු 04)

(v) සරල ආර්ථික සමාහාර පරිභෝජන ශ්‍රිතය $C = 250 + 0.75\ Y$ බවත් ආයෝජනය රුපියල් මිලියන 450 ක් බවත් උපකල්පනය කරන්න.

(අ) මෙම ආර්ථිකයේ ඉතුරුම් ශ්‍රිතය ලියා දක්වන්න. (ලකුණු 01)

(ආ) සමතුලිත ආදායමේ දී පරිභෝජන වියදම කොපමණද? (ලකුණු 02)

(vi) දෙන ලද කාලසීමාවක දී කිසියම් ආවෘත ආර්ථිකයක පූර්ණ සේවා නියුක්ති ආදායම් මට්ටම රු. මිලියන 1000 ක් යයි සලකන්න. පවත්නා සමතුලිත නිමවුම රු. මිලියන 800 කි. ස්වාධීන වියදම් වල මුළු වටිනාකම රු. මිලියන 200 කි.

(a) සේවා වියුක්ති තත්ත්වයක් යටතේ කටයුතු කරන මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම, ආදායම් වියදම් රූප සටහනක දක්වන්න. (ලකුණු 02)

(b) ප්‍රතිගමනාත්මක නිමවුම් පරතරය එහි පෙන්නුම් කරන්න. (ලකුණු 01)

iexamhub www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers Model Answers - Study Resources

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
තෙවන වාර පරීක්ෂණය 2024
ආර්ථික විද්‍යාව

12 ශ්‍රේණිය **I කොටස** **පිළිතුරු පත්‍රය**

1 - (3)	2 - (3)	3 - (4)	4 - (2)	5 - (2)	6 - (4)	7 - (2)	8 - (5)	9 - (3)	10 - (2)
11 - (4)	12 - (5)	13 - (5)	14 - (4)	15 - (3)	16 - (2)	17 - (3)	18 - (1)	19 - (5)	20 - (4)
21 - (1)	22 - (5)	23 - (2)	24 - (3)	25 - (5)	26 - (3)	27 - (5)	28 - (3)	29 - (5)	30 - (3)
31 - (5)	32 - (1)	33 - (5)	34 - (3)	35 - (2)	36 - (1)	37 - (2)	38 - (4)	39 - (2)	40 - (4)
41 - (4)	42 - (4)	43 - (3)	44 - (3)	45 - (5)	46 - (4)	47 - (3)	48 - (2)	49 - (2)	50 - (3)

II කොටස

01 (i) මෙම ප්‍රකාශය සත්‍ය නොවේ. මන්ද යත් නොමිල භාණ්ඩ යනු, අසීමිත සැපයුමක් ඇති හිඟකමක් නොමැති නිෂ්පාදනයේ දී හෝ පරිභෝජනයේදී ආවස්ථික පිරිවැයක් දැරීමට සිදු නොවන නිසා මිලක් ද ගෙවීමට සිදු නොවන භාණ්ඩයි. උදා :- හිරු එළිය, වාතය, වැසි ජලය (ල. 01)

එහෙත්,

ආර්ථික භාණ්ඩ යනු, සීමිත සැපයුමක් ඇති හිඟ කමක් දක්නට ලැබෙන නිෂ්පාදනයේදී හෝ පරිභෝජනයේදී පිරිවැයක් දැරීම නිසා මිලක් ගෙවීමට සිදුවන භාණ්ඩයි. උදා:- පුටු, මේස, ගෘහ භාණ්ඩ, ඇඳුම් පැළඳුම් ආදී... (ල. 01)

ඇතැම් අවස්ථාවලදී නොමිල භාණ්ඩ ආර්ථික භාණ්ඩ බවට පත් වුවත් නොමිල භාණ්ඩ යනු ආර්ථික භාණ්ඩ නොවේ. එබැවින් මෙම ප්‍රකාශය අසත්‍ය වේ. (ල. 02)

(ii) සාධක ඵලදායීතාවය යනු එක් යෙදවුම් ඒකකයකට ලබාගත හැකි සාමාන්‍ය නිමැවුම් ප්‍රමාණයයි. එය ගණනය කරනුයේ,

$$\text{සාධක ඵලදායිතාව} = \frac{\text{නිමැවුම}}{\text{යෙදවුම්}}$$ (ල. 02)

සාධක ඵලදායිතාව තීරණය කරන සාධක

- මානව ප්‍රාග්ධනය
- භෞතික ප්‍රාග්ධනය
- ස්වාභාවික ප්‍රාග්ධනය
- සමාජ ප්‍රාග්ධනය
- තාක්ෂණික දැනුම
- යහපත් ආකල්ප ආදී..... (ල. 02)

(iii) (අ)



(ල. 01)

නි.හැ.ලේඛනය

පරිගණක	රූපවාහිනිය
0	10
1	8
2	6
3	4
4	2
5	0

(ල. 01)

(ආ) විශේෂිත හැඩය ස්ථාවර අවස්ථික පිරිවැය (ල. 01)

හේතු -
- සම්පත් සමජාතීය වීම. (ල. 01)
- එක් නිෂ්පාදනයකට යෝග්‍ය සම්පත් අනික් නිෂ්පාදනයට ද යෝග්‍ය වීම. (ල. 01)

(iv) ද්‍රව්‍යාත්මක / ලාභ - වෙළෙඳපොළ ආර්ථික පද්ධතිය

බලය / විධාන - විධානගත/ සැලසුම්ගත ආර්ථිකය

යුක්තිය හා සාදාචාරය - සාම්ප්‍රදායික ආර්ථිකය (ල. 03)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(v) <u>මිශ්‍ර ආර්ථික ක්‍රමයක වාසි</u>

- පෞද්ගලික අංශය ලාභ අපේක්ෂාවෙන් සම්පත් බෙදා නො හරින අංශ කරා සම්පත් බෙදා වෙන්කිරීමට රජයට හැකි වීම. උදා- පොදු භාණ්ඩ හා සුභ සාධන භාණ්ඩ ප්‍රමාණවත්ව රජය මගින් සැපයීම.
- නීතිරීති පද්ධතිය රජය විසින් ක්‍රියාත්මක කිරීම මගින් පෞද්ගලික අංශය මෙහෙයවීම.
- පෞද්ගලික අංශයේ දේපල අයිතිය සුරක්ෂිත කිරීමට රජය මැදිහත් වීම.
- පෞද්ගලික අංශයේ සිදුවන නව්‍යතා හඳුන්වාදීම, නව තාක්ෂණය උපයෝජනය වැනි තත්ත්ව ඉදිරියේ රාජ්‍ය ව්‍යවසායන්ට ද ඊට අදාළ වෙනස්කම් කාලීනව සිදුකර ගතහැකි වීම. (සාම්ප්‍රදායික ශිල්ප ක්‍රම මත රඳා පැවතීමේ හැකියාව අහිමි වී යාම.)
- ඒකාධිකාරී ආයතන පාලනය කිරීම. (කරුණු 4 කට ලකුණු 04 යි.)

02 (i) යම් නිශ්චිත අවස්ථාවක ඉල්ලුමට බලපාන අනෙකුත් සාධක නොවෙනස්ව තිබිය දී සලකා බලන භාණ්ඩයේ මිලත්, ඉල්ලුම් ප්‍රමාණයත් අතර පවතින ප්‍රතිලෝම සම්බන්ධතාවයයි. එනම් සලකා බලන භාණ්ඩයේ මිල ඉහළයන විට ඉල්ලුම් ප්‍රමාණය අඩුවීම හෝ සලකා බලන භාණ්ඩයේ මිල පහළ යන විට ඉල්ලුම් ප්‍රමාණය වැඩිවීමත් ය. (ල. 02)

(ii) සාමාන්‍ය භාණ්ඩ - පාරිභෝගිකයාගේ ආදායම වැඩිවන විට ඉල්ලුම් කරන ප්‍රමාණය වැඩි කරන සහ පාරිබෝගික ආදායම අඩු වන විට ඉල්ලුම් ප්‍රමාණය අඩු කරන ස්වරූපයේ භාණ්ඩයි. (ල. 01)

බාල භාණ්ඩ - පාරිබෝගික ආදායම වැඩිවන විට ඉල්ලුම් කරන ප්‍රමාණය අඩු කරන සහ පාරිබෝගික ආදායම අඩුවන විට ඉල්ලුම් කරන ප්‍රමාණය වැඩි කරන භාණ්ඩ බාල භාණ්ඩ වේ. (ල. 01)

ගිෆන් භාණ්ඩ - අනෙකුත් කරුණු නොවෙනස්ව තිබිය දී භාණ්ඩයේ මිල වැඩි වන විට ඉල්ලුම් කරන ප්‍රමාණය වැඩිවන සහ මිල අඩු කරන විට ඉල්ලුම් කරන ප්‍රමාණය අඩු කරන භාණ්ඩ වේ. (ල. 01)

(iii) (අ)

$$Qd = QS$$
$$120 - 20p = -30 + 10p$$
$$120 + 30 = 10p + 20p$$
$$150 = 30p$$
$$5 = p$$ (ල. 01)

$$Qs = -30 + 10 \times 5$$
$$= -30 + 50$$
$$= 20$$

සමතුලිත මිල රු. 5
සමතුලිත ප්‍රමාණය = 20 (ල. 01)



(නිවැරදි ප්‍රස්ථාරයට ල. 02)

(ආ) පාරිභෝගික අතිරික්තය $= \frac{\text{උපරිම ඉල්ලුම් මිල - ස.මි.}}{2} \times$ ස. ඉ.

$= \frac{6-5}{2} \times 20 = 10$ (ල. 2)

නිෂ්පාදන අතිරික්තය $= \frac{\text{සමතුලිත මිල - අවම සැපයුම් මිල}}{2} \times$ සමතුලිත ප්‍රමාණය

$= \frac{5-3}{2} \times 20 = 20$ (ල. 2)

(iv) (අ) සැපයුමේ අන් භාණ්ඩ මිල ගණන්, නිෂ්පාදන යෙදවුම්වල මිල ගණන්, රාජ්‍ය ප්‍රතිපත්ති, නිෂ්පාදන තාක්ෂණය, සැපයුම්කරුවන් සංඛ්‍යාව, අනාගත මිල අපේක්ෂා, කාලගුණික සාධක සහ භූගෝලීය සාධක

විකල්ප පිළිතුර - සැපයුම් ශ්‍රිතයට අදාළ සාධක ඉංග්‍රීසි අක්ෂර වලින් ද දක්වා තිබේ නම් ලකුණු ලබාදිය හැකි ය. සලකා බලන භාණ්ඩයේ සැපයුම් මිල අදාළ නොවේ. (ඕනෑම එක් කරුණකට ල. 01 බැගින් ල. 03)

(ආ) නිෂ්පාදනයේ ආන්තික පිරිවැය ඉහළයාම - එනම් නිෂ්පාදනය කරන භාණ්ඩ ප්‍රමාණය වැඩිවන විට නිෂ්පාදනයේ ආන්තික පිරිවැය ද වැඩි වේ. නිමවුම ප්‍රසාරණය කරන විට ආන්තික පිරිවැය ඉහළයාමට බලපාන හේතු දෙකකි. එනම්,

<u>වැඩිවන ආවස්ථික පිරිවැය නීතිය</u> - නිෂ්පාදන හැකියා මායිම මත එක් භාණ්ඩයක නිෂ්පාදනය සමානව වැඩි කරන විට අනෙක් භාණ්ඩයේ නිෂ්පාදනයෙන් කැප කරන ප්‍රමාණය වැඩි වේ. මේ සඳහා සම්පත් සමජාතිය වීම, තාක්ෂණය වෙනස්වීම යන සාධක බලපානු ඇත. (ල. 01)

<u>හීනවන ආන්තික ඵලදාව</u> - කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලියේ අනෙකුත් යෙදවුම් ස්ථාවරව තබා ගෙන විචල්‍ය යෙදවුම් වැඩි කරන විට විචල්‍ය යෙදවුමේ ආන්තික ඵලදාව ක්‍රමයෙන් පහළ වැටීමක් සිදුවේ. හීනවන ආන්තික ඵලදාව නිසා ආන්තික පිරිවැය ඉහළ යයි. එබැවින් අතිරේක භාණ්ඩ ඒකකයක් නිපදවන විට ක්‍රමයෙන් යෙදවුම් ප්‍රමාණය ද වැඩි කිරීමට සිදුවේ. අවසානයේදී සිදු වන්නේ වැඩිපුර භාණ්ඩ ඒකකයක් සැපයීමට නිෂ්පාදකයා කැමැත්තක් දක්වනු ලබන්නේ භාණ්ඩය සඳහා ක්‍රමයෙන් වැඩි වන මිලක් ලැබෙනවා නම් පමණි. (ල. 01)

<u>නිෂ්පාදනයේ ලාභ අපේක්ෂාව / සාපේක්ෂ ලාභය</u>

කිසියම් භාණ්ඩයක මිල වැඩිවන විට එම භාණ්ඩ සැපයීමට නිෂ්පාදකයා වැඩි කැමැත්තක් දක්වයි. එයට හේතුව ලාභය මගින් සැපයුම්කරුවා දිරිමත්වීමයි. භාණ්ඩයේ හෝ සේවාවේ මිල ඉහළ යන විට එම භාණ්ඩ වැඩිපුර සැපයීම නිෂ්පාදකයාට ලාභය වැඩි කිරීමට හේතු වේ. (පැහැදිලි කිරීම නොමැතිව කරුණු දක්වා ඇත්නම් ල. 02) (ල. 04)

03 (i) ප්‍රදර්ශනාත්මක භාණ්ඩ, ගිෆන් භාණ්ඩ, මිලෙන් ගුණත්වය මනින භාණ්ඩ (එක් කරුණකට ල. එක බැගින් මුළු ල. 03)

(ii)

$$PED = \frac{\Delta Q}{\Delta P} \times \frac{P}{Qd}$$

$$-0.5 = \frac{-20}{\Delta P} = \frac{20\%}{-0.5} = 40\%$$

මිල රු. 168 ක් විය යුතුය. (ආදේශයට ල. 02) (විසඳීමට ල. 02) (මුළු ලකුණු 04)

(iii) <u>සලාක පත් නිකුත් කිරීම / කෝටා නිකුත් කිරීම</u> - පාරිභෝගිකයාට භාණ්ඩ ලබා ගැනීම සඳහා නිශ්චිත කූපනයකට අදාළව නිශ්චිත ප්‍රමාණයක් ලබා ගැනීමට සැලැස්වීම.

<u>පළමුව ආ තැනැත්තාට</u> පළමුව භාණ්ඩ නිකුත් කිරීම / පෝලිම් ක්‍රමයට භාණ්ඩ නිකුත් කිරීම - භාණ්ඩ නිකුත් කිරීමේ දී පාරිභෝගිකයින් පැමිණි පිළිවෙලකට භාණ්ඩය නිකුත් කිරීමයි.

<u>හිතවතුන් අතර භාණ්ඩ බෙදා හැරීම</u> - වෙළෙඳපොලේ අධි ඉල්ලුම් තත්ත්වයක් පවතින විට දීර්ඝ කාලයක් ගනුදෙනු කරන පාරිභෝගිකයින්ට, හිතවතුන්ට භාණ්ඩ නිකුත් කරයි.

<u>කළුකඩ මිල</u> - වෙළෙඳපොලේ තීරණය වන මිල ගණන් යටතේ නීති විරෝධි භාණ්ඩ ගනුදෙනු සිදු කරන වෙළෙඳපොළ මිලකි.

<u>අවස්ථානුකූලව භාණ්ඩ නිකුත් කිරීම.</u>

(එක් කරුණකට ල. 02 බැගින් ඕනෑම කරුණු තුනකට ල. 06)

(iv) <u>මිල වෙනස්වීමේ ආදායම් ප්‍රතිවිපාකය</u>

ඉල්ලුමට බලපාන අනෙකුත් කරුණු නොවෙනස්ව තිබිය දී භාණ්ඩයේ මිල වෙනස්වන විට හට ගන්නා මූර්ත ආදායම වෙනස්වීමෙන් ඉල්ලුම් ප්‍රමාණය වෙනස් වීම මිල වෙනස්වීමේ ආදායම් ප්‍රතිවිපාකය වේ.

එනම්, අනෙකුත් කරුණු නොවෙනස්ව තිබිය දී සලකා බලන භාණ්ඩයේ මිල පහළ යන විට මූර්ත ආදායම වැඩිවීමෙන්, එම භාණ්ඩය සාමාන්‍ය භාණ්ඩයක් නම් භාණ්ඩයට ඉල්ලුම් කරන ප්‍රමාණය වැඩි කරයි. එය මිල අඩු වීමේ ආදායම් ප්‍රතිවිපාකය වේ. (ල. 02)

<u>මිල වෙනස්වීමේ ආදේශන ප්‍රතිවිපාකය</u> - අනෙකුත් කරුණු නොවෙනස්ව තිබිය දී සාපේක්ෂ මිල වෙනස්වීම නිසා ඉල්ලුම් ප්‍රමාණයේ හට ගන්නා වෙනස්වීමයි. අනෙකුත් සාධක නොවෙනස්ව තිබිය දී සලකා බලන භාණ්ඩයේ මිල පහළ යන විට සාපේක්ෂව එම භාණ්ඩය ලාභදායී වේ. එබැවින් සාපේක්ෂව මිල අඩු භාණ්ඩය වැඩියෙන් මිලදී ගනී. එය මිල අඩු වීමේ ආදේශන ප්‍රතිවිපාකය වේ. (ල. 02)
(මිල පහළ යන විට ආදේශන සහ ආදායම් ප්‍රතිවිපාකය පැහැදිලි කිරීමට ල. 02 බැගින් මුළු ලකුණු 04 යි.)

(v)
- අපේක්ෂිත ඉල්ලුම් මිල සහ අපේක්ෂිත සැපයුම් මිල සමාන වීම.
- අපේක්ෂිත ඉල්ලුම් ප්‍රමාණය සහ අපේක්ෂිත සැපයුම් ප්‍රමාණය සමාන වීම.
- අධි ඉල්ලුම් මිල සහ අධි සැපයුම් මිල ශූන්‍ය වීම.
- අධි ඉල්ලුම් ප්‍රමාණය සහ අධි සැපයුම් ප්‍රමාණය ශූන්‍ය වීම.
- සමතුලිතයේදී පාරිභෝගික පැහැදම සහ නිෂ්පාදන අයභාරය සමාන වීම.
- ආර්ථික අතිරික්තය උපරිම වීම. (එක් කරුණකට ල. 1 බැගින් මුළු ල. 03)

04 (i) නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ ඒකකයක් සඳහා නිශ්චිත රුපියල් ප්‍රමාණයක් සහනාධාර වශයෙන් ලබාදීම සැපයුම්කරු මත ඒකක සහනාධාරයක් ලබාදීම යන්නෙන් අදහස් වේ. (ල. 02)

(ii)



(අ) සමතුලිත මිල රු. 4/- සමතුලිත ප්‍රමාණය 300 (ල. 02)

(ආ) නව සමතුලිත මිල රු. 3/- නව සමතුලිත ප්‍රමාණය 350 (රූප සටහනෙන් පෙන්නුම් කිරීමට ල. 02)

(ඉ) රජයේ සහනාධාර වියදම = සහනාධාරය x නව සමතුලිත ප්‍රමාණය
= 2 x 350
= රු. 700 (ල. 02)

(ඊ) සහනාධාරයෙන් පසු පාරිභෝගික අතිරික්තයේ වැඩිවීම.

$$\frac{(300+350)}{2} \times 1 = \frac{650}{2} = \text{රු. } 325$$ (ල. 01)

සහනාධාරයෙන් පසු නිෂ්පාදන අතිරික්තයේ වැඩිවීම.

$$\frac{(300+350)}{2} \times 1 = \text{රු. } 325$$ (ල. 01)

සහනාධාරයෙන් පසු ආර්ථික අතිරික්තයේ වැඩිවීම.

පසු පාරිභෝගික අතිරික්තයේ වැඩිවීම + නිෂ්පාදක අතිරික්තයේ වැඩිවීම.
= 325 + 325
= රු. 650 (ල. 01)

සහනාධාරය සඳහා රජයේ වියදම

රු. 2 x 350 = රු. 700

සහනාධාරය සඳහා රජයේ පිරිවැය - ආර්ථික අතිරික්තයේ වැඩිවීම.

= 700 - 650

= රු. 50

සහනාධාරය නිසා සමාජයට ශුද්ධ වශයෙන් රු. 50 ක් අහිමි වී යයි. (ල. 01)

(iii)



(රූප සටහනට ල. 01) (රූප සටහනට ල. 01)

(අ) බදු බර වැඩියෙන් පාරිභෝගිකයා දරන්නේ ඉල්ලුම් නම්‍යතාව එකට අඩුවූ විටයි. එනම් අනම්‍ය ඉල්ලුම් තත්වයකදීය. (ල. 01)

(ආ) බදු බර වැඩියෙන් නිෂ්පාදකයා දරන්නේ ඉල්ලුම් නම්‍යතාව එකට වැඩි වූ විටයි. එනම් නම්‍ය ඉල්ලුම් තත්වයකදීය. (ල. 01)

(iv) * ඒකක බද්දක් පැන වූ විට සැපයුම් වක්‍රයට කිසිදු වෙනසක් සිදු නොවන්නේ සැපයුම පූර්ණ අනම්‍ය වූ විටයි.

* පූර්ණ අනම්‍ය සැපයුමක් පවතින විට බද්දට පෙරත් බද්දට පසුත් සමතුලිතයෙහි කිසිදු වෙනසක් සිදු නොවේ.
මුළු බදුබරම නිෂ්පාදකයා විසින් දරනු ලැබේ.

* එබැවින් පෙර නිෂ්පාදක අතිරික්තය $P_1E_1Q_1$ O ප්‍රදේශයෙන් පෙන්නුම් කරන අතර බදු පැනවීමෙන් පසු නිෂ්පාදන අතිරික්තය $OP_2\,E_2\,Q_1$ ප්‍රදේශයෙන් පෙන්නුම් කරයි. $P_1P_2E_2\,E_1$ ප්‍රමාණයෙන් නිෂ්පාදක අතිරික්තය අඩු වී ඇත.



(රූප සටහනට ල. 02)

E_1 - E_2 ඒකක බද්දේ ප්‍රමාණය

(නිෂ්පාදක අතිරික්තයේ හටගන්නා අඩුවීම පැහැදිලි කිරීමට ල. 02 යි.)

05 (i) (a) පාරිභෝගික ඉල්ලුම් ප්‍රමාණය

$$Qd = 240 - 2P$$

$$Qd = 240 - 2 \times 100$$

$$= 240 - 200$$

$Qd = 40$ (ඒකක) (ල. 01)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

සැපයුම් ප්‍රමාණය

$$Q_s = -210 + 3P$$
$$= -210 + 3 \times 100$$
$$= -210 + 300$$
$$Q_s = 90$$ (ඒකක) (ල. 01)

(b) වෙළෙඳ පොළ අධි සැපයුම

අධි සැපයුම = Qs - Qd
= 90 - 40
ඒකක = 50 (ල. 01)

(c) රජයේ පිරිවැය = අධි සැපයුම් ප්‍රමාණය x ආධාරක මිල
= 50 x 100
= රු. 5000/- (ල. 01)

(d)



අහිමිවන ශුභ සාධනය $= \frac{(100-75) \times (90-60)}{2}$

$= \frac{25 \times 30}{2}$

= රු. 37.5 (ප්‍රස්තාරයට ල. 02 යි. නිවැරදි ගණනය කිරීමට ල. 02 යි.)

(ii)
- අධි ඉල්ලුම නිසා වෙළෙඳපොලේ භාණ්ඩ හිඟයක් ඇති වීම.
- නීති විරෝධි කළු කඩ මිල යටතේ භාණ්ඩ අලෙවි කිරීමට වෙළෙඳුන් තැත් කිරීම.
- මිල නොවන සලාකන ක්‍රම යටතේ හිඟ භාණ්ඩ සලාකනය කිරීම.
- කළු කඩ මිල නිසා පෙර තිබූ සමතුලිත මිලටත් වඩා ඉහළ මිලකට භාණ්ඩ අලෙවි කිරීම.
- උපරිම මිලක් සමගින් නිෂ්පාදකයන්ගේ ලාභ සීමා වන නිසා එම නිෂ්පාදන ක්ෂේත්‍රයේ කරනු ලබන ආයෝජන සීමා වීම.
- උපරිම මිල නිසා පාරිභෝගික හා නිෂ්පාදන අතිරික්තයට බලපෑම් ඇති වී සමාජ සුබ සාධනයට හානි වීම. (කරුණකට ල. 01 බැගින් ල. 04)

(iii)
- සහතික මිල ක්‍රමයක් හඳුන්වා දීම.
- නිෂ්පාදන සලාක හෙවත් කෝටා ලබාදී සැපයුම් සීමා කිරීම.
- ස්වාරක්ෂක තොග රැස්කිරීම හා මුදා හැරීම.
- අපනයන සහනාධාර ලබාදීම.
- වෙළෙඳපොළ තත්ත්වය පිළිබඳ නිවැරදි තොරතුරු කල්තබා සැපයීම.
- භූමිය වගාව සඳහා යොදා නොගැනීම දිරිමත් කිරීම පිණිස ගෙවීමක් කිරීම.
- ඌණ පූර්ණ ගෙවීම් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම. (ඕනෑම කරුණු 04 කට ල. 04)

(iv) ♦ මිල පාලන ප්‍රතිපත්ති දැඩිලෙස ක්‍රියාත්මක කර පාලන මිලට භාණ්ඩ අලෙවි කිරීම සඳහා උනන්දු කිරීම.

♦ ප්‍රථමයෙන් මිලට ගැනීමට හා පුද්ගලයාට ප්‍රථමයෙන් අලෙවි කිරීම.

♦ සලාක කිරීම.

♦ ඌණ භාණ්ඩ තොග ආනයනය කර අධි ඉල්ලුම පියවීම. (කරුණකට ල. 01 බැගින් ල. 04)

06 (i) ♦ සියලුම යෙදවුම් විචල්‍ය යෙදවුම් වශයෙන් පවත්නා දිගු කාලයේදී අඩුවන පරිමානාණුකූල ඵල හටගනී. විචල්‍ය යෙදවුමක හීනවන ඵල හටගන්නේ ස්ථාවර යෙදවුම් නොවෙනස්ව තබාගෙන විචල්‍ය යෙදවුම් පමණක් වැඩිකල හැකි කෙටිකාලයේ දීය. (ල. 02)

♦ අඩුවන පරිමානාණුකූල ඵල පෙන්නුම් කරනුයේ විචල්‍ය යෙදවුම් වැඩිකරන විට කාර්යක්‍ෂමතාව වෙනස්වන ආකාරයයි. (කර්යක්‍ෂමතාව අඩු වීමයි.) විචල්‍ය යෙදවුමක හීනවන ඵල පෙන්නුම් කරනුයේ දෙන ලද ස්ථාවර යෙදවුම් ප්‍රමාණයක් සමග විචල්‍ය යෙදවුමක් වැඩිකරන විට විචල්‍ය යෙදවුම් කාර්යක්‍ෂමතාව වෙනස් වන ආකාරයයි. (ල. 02)

(ii) **සමානකම්**

♦ ආයතන සංඛ්‍යාව විශාල වීම.

♦ කර්මාන්තය තුළ එක් ආයතනයක් සාපේක්ෂ වශයෙන් නොවැදගත් වීම.

♦ අබාධ පිවිසුම හා අබාධ පිටවීම.

♦ දිගු කාලයේ දී නිෂ්ප්‍රමාණික ලාභ නොමැති වීම. (ඕනෑම කරුණු 2 කට ල. 02)

අසමානකම්

පූර්ණ තරගය	**ඒකාකාරී තරගය**
♦ සමජාතීය භාණ්ඩ නිෂ්පාදනය	♦ ප්‍රභේදිත භාණ්ඩ නිපදවයි.
♦ මිල ගනුවෙකු වේ.	♦ මිල තීරකයෙකු වේ.
♦ පූර්ණ නම්‍ය ඉල්ලුම් වක්‍රය	♦ පහළට බෑවුමවන ඉල්ලුම් වක්‍රය

(ඕනෑම කරුණු 02 කට ල. 02)

(iii)

	සාමාන්‍ය මුළු පිරිවැය	සාමාන්‍ය විචල්‍ය පිරිවැය
(අ)	අඩු වේ.	අඩු වේ.
(ආ)	වැඩි වේ.	වැඩි වේ.
(ඉ)	වැඩි වේ.	වෙනස් නොවේ.
(ඊ)	වැඩි වේ.	වෙනස් නොවේ. (ල. 04)

(iv) (අ) ♦ සංක්‍රාම ඉපයීම - කිසියම් සාධකයක් පවත්නා භාවිතයෙහි රඳවා තබා ගැනීමට පෙළඹවීම සඳහා අපේක්‍ෂා කරන අවම ආදායම එම සාධකයේ ආවස්ථික පිරිවැය හෙවත් සංක්‍රාම ඉපයීම වේ. (ල. 01)

♦ ආර්ථික බදු කුලිය - කිසියම් නිෂ්පාදන සාධකයක හිමිකරුවෙක් එම සාධකය පවත්නා භාවිතයෙහි රඳවා තබා ගැනීම සඳහා අපේක්‍ෂා කරන අවම ගෙවීම ඉක්මවා උපයා ගන්නා ආදායම ආර්ථික බදු කුලිය වේ. (ල. 01)



(රූප සටහනට ල. 01)

ඉහත රූප සටහනට අනුව O W_1 R ත්‍රිකෝණය මගින් ආර්ථික බදු කුලිය නිරූපණය වන අතර OR Q_1 ත්‍රිකෝණය මගින් සංක්‍රාම ඉපයීම පෙන්නුම් කෙරේ.

ඒ කෙසේ නමුදු නිෂ්පාදන සාධකයක ආදායමෙන් ආර්ථික බදු කුලියේ ප්‍රමාණයත්, සංක්‍රාම ඉපයීමත් තීරණය වනුයේ එම සාධකයේ සැපයුම් නම්‍යතාව මතය. (ල. 01)

(ආ) රු. 100 000.00 (ල. 02)

(ඉ) ඔව්. රු. 150 000 ක ආර්ථික බදු කුලියක් උපයයි. මෙම ව්‍යාපාරය අපේක්ෂිත කාර්ය සාධනය පෙන්නුම් කරයි නම් මෙම ව්‍යාවසායිකාව අපේක්ෂිත බදු කුලියක් උපයාගැනීමට සමත් වෙයි. ඇයගේ සංක්‍රාම ඉපයීම රු. 100 000 වන අතර මුළු ඉපයීම රු. 250 000 වීම හේතුවෙන් රු. 150 000.00 ක ආර්ථික බදු කුලියක් ඉපයීමට ඇය සමත් වෙයි. (ල. 02)

07 (i)

- ගිණුම්කරණ ලාභය යනු ආයතනයේ මුළු අයභාරයෙන් ප්‍රත්‍යක්ෂ පිරිවැය (Explicit cost) හෙවත් ඍජු පිරිවැය අඩු කළ විට ශේෂ වන ප්‍රමාණයයි. (ල. 02)
- ආර්ථික ලාභය යනු ප්‍රත්‍යක්ෂ පිරිවැය සහ ආරෝපිත පිරිවැය (Implicit Cost) හෙවත් ව්‍යංග පරිවැය යන දෙකම සලකා බලන පුළුල් මිනුමක් වේ.

මෙම පිරිවැය දෙකම එක්ව ගත්කල එය ආර්ථික පිරිවැය නැතහොත් ආවස්ථික පිරිවැය ලෙස නම් කෙරේ. ඒ අනුව, ආර්ථික ලාභය යනු ආයතනයේ මුළු අයභාරයෙන් ආවස්ථික පිරිවැය අඩු කළ විට ලැබෙන ශේෂයයි. (ල. 02)

(ii) කතිපයාධිකාරී වෙළඳපොළ, ඒකාකාරී වෙළඳපොළක් සමඟ සැසඳීම.

	කතිපයාධිකාරී වෙළඳපොළ	ඒකාධිකාරය
1.	නිෂ්පාදන ආයතන සංඛ්‍යාව අතලොස්සක් වන නමුදු එක් එක් ආයතනයේ ප්‍රමාණය ඉතා විශාල වීම.	මිලදී ගන්නන් විශාල සංඛ්‍යාවක් සිටින නමුදු එක් තනි අලෙවිකරුවෙක් පමණක් සිටී.
2.	සමජාතීය හෝ ප්‍රභේදිත භාණ්ඩ නිපදවයි.	සුවිශේෂී නිෂ්පාදනයක් නිපදවයි.
3.	නොමිල තරඟය (Non-priced competition)	තරඟකාරීත්වයක් දක්නට නොමැත.
4.	මිල තීරණය කිරීමේදී ආයතන අතර අන්‍යෝන්‍ය රැඳියාව.	මෙම වෙළඳපොලෙහි අලෙවිකරුවන් මිල සකසන්නන් (Price makers) ලෙස සැලකේ.
5.	ව්‍යවර්ති ඉල්ලුම් වක්‍රයක් පැවතිය හැකි වීම.	පහළට බෑවුම්වන ඉල්ලුම් වක්‍රයක් පැවතීම.
6.	මිල දෘඪතාව (Price rigidity)	අලෙවිකරුවන්ට වෙළඳපොල මිල කෙරෙහි පූර්ණ පාලන බලයක් ඇත. විවිධ ගැනුම්කරුවන් සඳහා විවිධ මිල අයකර ගැනීමේ හැකියාව පවතී.

(සැසඳීම් 04 කට ල. 04)

(iii) ආර්ථික පිරිමැසුම් හේතු

- ශ්‍රමය භාවිතා කිරීමේදී විශේෂ ප්‍රාගුණ්‍යය ඉහළ යාම.
- ප්‍රාග්ධන උපකරණ වඩාත් කාර්යක්ෂම ලෙස උපයෝජනය වීම.
- අලෙවි කිරීමේ පරිමාණානුකූල පිරිමැසුම්.
- මූල්‍යමය පරිමාණානුකූල පිරිමැසුම්.
- අවධානම් දැරීම සම්බන්ධයෙන් ඇති පරිමාණානුකූල පිරිමැසුම

(එක් කරුණකට 1 බැගින් ඕනෑම කරුණු 3 කට ල. 03)

ආර්ථික නොපිරිමැසුම් - හේතු

- කළමනාකාරීත්වය හා සම්බන්ධකරණ ගැටළු
- කම්කරු සම්බන්ධතා දුර්වලවීම නිසා ඵලදායිතාව අඩුවීම හා නිෂ්පාදන පිරිවැය ඉහළ යාම.
- ප්‍රධාන කාර්යාලයෙන් දුරස්ථ ස්ථානයන්හි අලුත් ශාඛා ආරම්භ කිරීම නිසා ප්‍රවාහන වියදම් ඉහළ යාම.
- විශාල පරිමාණ නිෂ්පදන ක්‍රියාවලි සතු ශ්‍රමිකයන් පිටස්තරයන් යන හැඟීමෙන් විය හැකි ආකාරය.

(එක් කරුණකට 1 බැගින් ඕනෑම කරුණු 03 කට ලකුණු 03)

(iv)



(නිවැරදි රූප සටහනට ල. 02)

MR < ATC (ල. 01)
නමුත්
MR > AVC (ල. 01)

මුළු අයභාරය මගින් මුළු පිරිවැය ආවරණය නොවුවද වෙළඳපොළ මිල මුළු විචල්‍ය පිරිවැය සම්පූර්ණයෙන්ම ආවරණය කිරීමට සමත්වනවා පමණක් නොව මුළු ස්ථාවර පිරිවැයෙහි කොටසක් ද ආවරණය කිරීමට සමත් වීම හේතුවෙන්, නිෂ්පාදනය තුළ පාඩු ලැබූවද ආයතනය වසා නොදමා කෙටි කාලීනව පාඩුව විඳ දරාගෙන අනාගත ලාභ අපෙක්ෂවෙන් පවතින නිෂ්පාදනය Q_1 පවත්වාගෙන යාමට ආයතනය කටයුතු කරයි. (ල. 02)

08 (i)
- දළ මෙහෙයුම් අතිරික්තය යනු සමාගමික අංශයේ ව්‍යවසායකයින් විසින් ජනනය කෙරෙන ආදායම්ය. මේ තුළ ශ්‍රමය හැරුණු කොට නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදා ගන්නා අනෙකුත් සියලුම නිෂ්පාදන සාධක සඳහා ජනනය වන ආදායම් හෙවත් පොලිය, බදු කුලී හා දළ ලාභවලින් යුත් දේපල ආදායම් ඇතුළත් වේ. ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනයේ වටිනාකම ඇතුළත් මෙහෙයුම් අතිරික්තය, දළ මෙහෙයුම් අතිරික්තය ලෙස හඳුන්වනු ලැබේ. (ල. 01)
- කේවල හෝ හවුල් ව්‍යාපාරයක් ලෙස හෝ කුටුම්භ විසින් කරනු ලබන ව්‍යවසායක කටයුතු මගින් ජනනය වන ආදායම් හෙවත් සමාගමික නොව ව්‍යාපාරික අංශය විසින් බිහිකල ආදායම් මිශ්‍ර ආදායම් ලෙස සැලකේ. මෙම ආදායම් පැහැදිලි ලෙස සේවක ආදායම්, දේපල ආදායම් හෝ මෙහෙයුම් අතිරික්තය ලෙස වෙන්කොට දැක්වීම අපහසු ය. මේ නිසා කුටුම්බ අංශයේ ව්‍යාපාරික කටයුතු ආශ්‍රයෙන් බිහිවන ආදායම් මිශ්‍ර ආදායම් ලෙස සැලකේ. (ල. 01)

(ii) තනි ආණ්ඩුවක සඵල ආර්ථික පාලනයකට නතු වූ පුද්ගලයන්ට භාණ්ඩවලට හා ප්‍රාග්ධනයට නිදහසේ සංචල විය හැකි භූගෝලීය ප්‍රදේශය ආර්ථික ප්‍රදේශය ලෙස හැඳින්විය හැකිය. (ල. 02)
- භූමි ප්‍රදේශය
- ජාතික ගුවන් අවකාශය
- දේශාන්ත මුහුදු සීමාව හා ඊට අයත් ධීවර, ඉන්ධන, හා ඛනිජ සම්පත් හිමිකම.
- සලකා බලන රටට හිමිකම් කියන අන් රටවල පිහිටි පරිවාරක ප්‍රදේශ (අදාළ රටට අයත් විදේශ තානාපති කාර්යාල, කොන්සල් කාර්යාල, හමුදා කඳවුරු, පර්යේෂණ මධ්‍යස්ථාන ආදිය....)

(ඕනෑම කරුණු 1 කට ල. 01)

(iii)
- අතරමැදි යෙදවුම්

නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා පිටතින් මිලදී ගනු ලබන භාණ්ඩ හා සේවා අතරමැදි යෙදවුම් ලෙස හඳුන්වනු ලැබේ.
මේවා නිෂ්පාදනය කරන ලද යෙදවුම්ය. මෙම යෙදවුම් නිෂ්පාදන ක්‍රියාවලියට යොදා ගත්විට ක්‍රියාවලිය තුළම අවසානයට පත් වේ.
උදා:- පොහොර, අමුද්‍රව්‍ය, ජලය, විදුලිය, ලිපිද්‍රව්‍ය, උපදේශන සේවා. (ල. 02)

- ප්‍රාථමික යෙදවුම්.

නිෂ්පාදන ක්‍රියාවලියට යොදා ගන්නා නිෂ්පාදන ක්‍රියාවලිය තුළ අතුරුදන් වී නොයන නිෂ්පාදන ක්‍රියාවලිය අවසානයේ නැවතත් පෙනී සිටින යෙදවුම් ප්‍රාථමික යෙදවුම් වේ.
මෙම යෙදවුම්වලට නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා නැවත නැවතත් සහභාගී වීමේ හැකියාව පවතී. මේවා එකතු කළ අගය බිහිකරන යෙදවුම් ලෙස ද හැඳින්වේ.
උදා:- භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය. (ල. 02)

iexamhub www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers Model Answers - Study Resources

(iv) (a) දළ දේශිය වියදම = පෞද්ගලික පරිභෝජන වියදම + රාජ්‍ය පරිභෝජන වියදම + අයෝජනය (ල. 01)

දළ දේශීය වියදම $= 15000 + 12000 + 10000$

$=$ රු. බිලියන 37000 (ල. 01)

(b) දළ දේශීය නිෂ්පාදිතය = දළ දේශීය වියදම + ශුද්ධ අපනයන (ල. 01)

දළ දේශීය නිෂ්පාදිතය $= 37000 + 1500$

$=$ රු. බිලියන 38500 (ල. 01)

(c) ශුද්ධ ජාතික ආදායම

= දළ දේශීය නිෂ්පාදනය + විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම - ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය (ල. 01)

ශුද්ධ ජාතික ආදායම $= 38500 + (-1000) - 800$

$=$ රු. බිලියන 36700 (ල. 01)

(v) (අ) පරිභෝජන ශ්‍රිතය $C = a + byd$

$C = 500 + 0.75\,y$ (ල. 02)

(ආ) සමතුලිත ජාතික ආදායම $y = C + I + G$ (ල. 01)

$y = 500 + 0.75\,y + 100 + 180$

$y = 780 + 0.75\,y$ (ල. 01)

$y - 0.75\,y = 780$

$0.25\,y = 780$

$y = \frac{780}{0.25}$

$y = 3120$ (රු. මිලියන)

සමතුලිත ජාතික ආදායම රු. මිලියන 3120 (ල. 01)

09 (i) (a) අනේවාසික (b) නේවාසික (c) නේවාසික (d) නේවාසික (ල. 04)

(ii) දළ දේශිය නිෂ්පාදනය යනු දෙන ලද කාල පරිච්ඡේදයකදී කිසියම් රටක ආර්ථික ප්‍රදේශය තුළ සිටින සියලුම නේවාසික ආයතන විසින් බිහිකරන ලද සමස්ත එකතු කළ අගයයි.

දළ ජාතික ආදායම යනු අදාළ රටේ ආර්ථික ප්‍රදේශය තුළ සිදුවන නිෂ්පාදනයේ එකතුකල අගය පමණක් නොව, සලකා බලන වර්ෂය තුළ එම රටේ නේවාසික ආයතනික ඒකකයන්ට හිමිවන සමස්ත ආදායමේ ප්‍රමාණයයි.

දළ දේශීය නිෂ්පාදනයේ අගයට විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම ගැළපූ විට දළ ජාතික ආදායම ලැබේ. විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම ධන (+) අගයක් ගන්නා විට දළ ජාතික ආදායමේ අගය (+) දළ දේශීය නිෂ්පාදනයට වඩා ඉහළ අගයක් ගනී. (ලකුණු 02)

(iii) (a) මූලික මිලට දළ එකතු අගය = සේවක ආදායම් + දළ මෙහෙයුම් අතිරික්තය + මිශ්‍ර ආදායම + නිෂ්පාදනය මත වෙනත් ශුද්ධ බදු (ල. 01)

මූලික මිලට දළ එකතු කළ අගය $= 3000 + 5000 + 6000 + 100$

$=$ රු. බිලියන 14 100 (ල. 01)

(b) නිෂ්පාදිතය මත ශුද්ධ බදු = දළ දේශීය නිෂ්පාදනය - මූලික මිලට දළ එකතු කල අගය (ල. 01)

නිෂ්පාදිතය මත ශුද්ධ බදු $= 15000 - 14\,100$

$=$ රු. බිලියන 900 (ල. 01)

(c) දළ ජාතික ආදායම = දළ දේශීය නිෂ්පාදිතය + විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම (ල. 01)

දළ ජාතික ආදායම $= 15000 + (-200)$

$=$ රු. බිලියන 14 800 (ල. 01)

(d) වැය කළ හැකි ශුද්ධ ජාතික ආදායම = දළ ජාතික ආදායම - ස්ථාවර ප්‍රාග්ධනය පරිභෝජනය + විදේශ ශුද්ධ ද්විතීයික ආදායම (ල. 01)

වැයකළ හැකි ශුද්ධ ජාතික ආදායම $= 14800 - 1000 + 500$

$= 14\,300$

$=$ රු. බිලියන 14 300 (ල. 01)

(iv) විවෘත ආර්ථිකයක සමතුලිතය ආදායම් වියදම් ප්‍රවේශය ඇසුරින්,



(ල. 02)

විවෘත ආර්ථිකයක සමතුලිතය විදීම් හා කාන්දුවීම් ප්‍රවේශය ඇසුරින්



(ල. 02)

(v) බදු ගුණකය

$$K_T = \frac{b}{1 - b}$$

$$= \frac{0.75}{1 - 0.75}$$

$$= \frac{0.75}{0.25}$$

$$= 3$$

ස්වායත්ත බදු රු. බිලියන 50 කින් වැඩි වූ විට දළ දේශීය නිෂ්පාදිතය වෙනස් වන ආකාරය

$$K_T \times 50 = \frac{b}{1 - b} \times 50$$

$$= 3 \times 50$$

= රු. බිලියන 150 (ල. 01)

ස්වායත්ත බදු රු. බිලියන 50 කින් වැඩි වූ විට දළ දේශීය නිෂ්පාදනය රු. මිලියන 150 කින් සංකෝචනය වේ. (ල. 01)

10 (i) බහු ගණන දෝෂය යනු ජාතික ගිණුම්කරණයේදී එකම නිමැවුමේ අගය නිෂ්පාදනයේ විවිධ අවදීන් පසුකරන විට එක් වරකට වඩා එකතු වීමයි. මෙම දෝෂය නිසා ජාතික ගිණුම් අධි තක්සේරුවට ලක්වේ. (ල. 02)

බහු ගණන දෝෂය මගහරවා ගැනීම සඳහා සමස්ත නිෂ්පාදනය ගණනය කිරීමේදී විකල්ප ක්‍රම 2 ක් පවතී.

1. එකතු කළ වටිනාකම ක්‍රමය
2. අවසාන නිෂ්පාදිත ක්‍රමය (ල. 02)

(ii) ♦ ජාතික ගිණුම් සැකසීමේදී නිෂ්පාදන, ආදායම් හා වියදම් ප්‍රවේශ පිළිඹිබු කරනුයේ එකම ක්‍රියාවලියක් මිනුම් කිරීම සඳහා භාවිත කරන විවිධ පැතිකඩ තුනකි. නිෂ්පාදන ප්‍රවේශය ඔස්සේ මිනුම් කරනුයේ රට තුළ නිෂ්පාදනය කරන ලද සියලුම අවසාන භාණ්ඩ හා සේවාවල වටිනාකමයි.

♦ අවසාන භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා දායක වූ නිෂ්පාදන සාධක වලට කරන ලද මුළු ගෙවීම් ප්‍රමාණයේ වටිනාකම ආදායම් ප්‍රවේශයෙන් මිනුම් කෙරේ. නිෂ්පාදනයේ වටිනාකම අවශ්‍යයෙන්ම නිෂ්පාදනය බිහිකිරීම සඳහා දායක වූ නිෂ්පාදන සාධකවල වටිනාකමට සමාන විය යුතු බැවින් ආදායමේ වටිනාකමත් නිෂ්පාදනයේ වටිනාකමත් සමාන වේ.

♦ වියදම් ප්‍රවේශය ඔස්සේ මිනුම් කරනුයේ අවසාන භාණ්ඩ හා සේවා ප්‍රමාණය මිලදී ගැනීම සඳහා වැය කළ යුතු මුළු වියදමේ වටිනාකමයි. නිමැවුමේ වටිනාකම නිමැවුම මිලදී ගැනීම සඳහා වැය කරන ලද මුදල් ප්‍රමාණයට සමාන විය යුතු බැවින් නිමැවුමේ වටිනාකම සහ වියදමේ වටිනාකම එකිනෙකට සමාන විය යුතුය. මේ අනුව බලන විට නිමැවුම්, ආදායම් හා වියදම් ප්‍රවේශ ලබාදෙන්නේ සමස්ත නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා එකම වටිනාකමකි.

(කරුණු 1 ට ල. 01 බැගින් ල. 03)

(iii) ♦ නොගෙවූ ගෘහ සේවය

♦ නොමිලේ ලැබෙන ස්වාභාවික සම්පත්

♦ ඉගෙනීම හා විවේකය

♦ මිනිස් ශ්‍රමයකින් තොරව වර්ධනය වන ස්වභාවික සම්පත්

♦ මිල වෙනස්වීම හෝ ස්වභාවික වර්ධනය මගින් සම්පත්වල වටිනාකම වෙනස් වීම.

(කරුණු 1 කට ලකුණු 1 බැගින් ලකුණු 03)

(iv) ♦ ජීවිතය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කරන අවම පරිභෝජන වියදම් ප්‍රමාණය ස්වාධීන පරිභෝජනය මගින් පෙන්නුම් කරයි. එය පවත්නා ආදායම් මට්ටම සමග සබඳතාවයක් නොදක්වයි. එබැවින් ආදායම ශුන්‍ය වුවද ජීවිතය පවත්වාගෙන යාමට මෙම වියදම දැරිය යුතුය.

♦ පෙළඹුණ පරිභෝජන වියදම යනු ආදායමේ වෙනස් වීම මත වෙනස් වන පරිභෝජන වියදමේ ප්‍රමාණයයි. මුළු පරිභෝජන වියදමින් ස්වායක්ත පරිභෝජන වියදම අඩු කළ විට පෙළඹුණ පරිභෝජන වියදම ලැබේ. (ල. 02)

(v) (අ) $S = -250 + 0.25Y$ (ල. 01) (ලකුණු 01)

(ආ) සමතුලිත ආදායම $Y = C + 1$

$$Y = 250 + 0.75Y + 450$$
$$Y = 700 + 0.75Y$$
$$Y - 0.75Y = 700$$
$$Y = \frac{700}{0.25}$$
$Y = 2800$ (ල. 01)

$$C = 250 + 0.75 \times 2800$$
$C = 2350$ (ල. 01)

(vi) (a)



(නිවැරදි රූප සටහනට ල. 02)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub